වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT 2019

ශ්‍රම වාසනා අරමුදල
சிரம வாசனா நிதியம்
SHRAMA VASANA FUND



www.svf.gov.lk

	පටුන	පිටුව
ආයතනික තොරතුරු		
*	මෙහෙවර හා දැක්ම	02
*	මූලික අගයන් සහ චර්යාධර්ම	03
*	ශ්‍රම වාසනා අරමුදල හා එහි අරමුණු.	04
*	පාලන ව්‍යුහය	05
*	අනු කමිටු	06 - 07
*	විගණන හා කළමනාකරණ කමිටු තීරණ	08 - 12
*	සංවිධාන සටහන	13
*	අරමුදල සඳහා ලැබීම්	14
*	අරමුදලේ වර්ධනය හා ලොතරැයි ආදායම	15
*	මූල්‍ය කාර්යසාධන සමාලෝචනය	16 – 17
*	1998 - 2019 විශේෂ අවස්ථා	18 – 19
*	ඉදිරි අභියෝග සහ වගකීම්	20
*	2019 වැඩසටහන් සමාලෝචනය	21 – 35
*	ප්‍රතිලාභීන් සංයුතිය	36
මූල්‍යමය තොරතුරු		
*	මූල්‍ය තත්ව ප්‍රකාශය	38
*	මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය	39
*	ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය	40
*	අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය	41
*	ගිණුම්කරණ ප්‍රතිපත්තිය	42 - 47
*	ගිණුම් වලට අදාල සටහන්	48 - 52
*	විගණකාධිපති වාර්තාව	53 - 58
*	විගණන වාර්තාව පිලිබඳ අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය	59 - 60
*	ඇමුණුම	61 - 62

මෙහෙවර හා දැක්ම ...

දැක්ම (Vision)

"තෘප්තිමත් ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්"

මෙහෙවර (Mission)

"කම්කරු ප්‍රජාවට සුබ සාධනය සැපයීම හා විපතකදී පිහිටවීම සඳහා පවතින යාන්ත්‍රණයන්ගේ අඩුපාඩු පුරවමින් වඩා පොහොසත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා දායකත්වය සැපයීම"

මූලික අගයන් සහ චර්යාධර්ම.

- ශ්‍රම වාසනා අරමුදලින් ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් සඳහා කාර්යක්ෂම වූ සේවාවක් සැපයීම සඳහා වන සදාචාරාත්මක බැඳීම තහවුරු කිරීම.
- සේවාලාභීන් සඳහා සේවා සැපයීමේදී ශ්‍රම වාසනා අරමුදලේ නීති රෙගුලාසි හා ක්‍රමවේදයන් ට යටත්ව ඉහල ගුණාත්මක සේවාවක් ලබා දීම.
- ශ්‍රම වාසනා අරමුදල මගින් සිදුකරනු ලබන සේවාවන් පිළිබඳව සේවා ලාභීන් තුළ වඩා දැනුවත් භාවයක් ඇති කිරීම.

ශ්‍රම වාසනා අරමුදල

1998 අංක 12 දරණ (2019 අංක 15 දරණ සංශෝධිත) පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල මුදල් අමාත්‍යාංශය යටතේ පවතින කම්කරු සුභ සාධනය උදෙසා ආරම්භ කරන ලද ආයතනයකි. ශ්‍රම වාසනා අරමුදල් පනතේ අරමුණු 6 ක් ඔස්සේ ආරම්භයේ සිට මේ දක්වා විවිධ සුභ සාධන වැඩසටහන් පවත්වා ශ්‍රී ලංකීය සේවා නියුක්තිකයින්ගේ උන්නතියට කටයුතු සම්පාදනය කර ඇත.

ශ්‍රම වාසනා අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය ලෙස සෙනසුරාදා දිනුම් අදිනු ලබන ජාතික සම්පත ලොතරැයිය පෙන්වා දිය හැකිය. ලොතරැයි අලෙවියත් සමඟ ආදායම ක්‍රමයෙන් වැඩිවෙමින් පවතින අතර එම වැඩිවීමත් සමඟ කම්කරු සුභ සාධනය උදෙසා සිදු කිරීමට නියමිත සේවාවන් ද වර්ධනය කර ඇත.

ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු

(අ) සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම.

(ආ) සේවා නියුක්තයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ අවස්ථාවක ඒ සේවා නියුක්තයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම.

(ඇ) හදිසි අවස්ථා වලදී සේවා නියුක්තයන්ට හා ඔවුන්ගේ යැපෙන්නන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම.

(ඈ) සේවා නියුක්තයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටකදී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම.

(ඉ) ව්‍යසන අවස්ථා වලදී සේවා නියුක්තයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය හා වෙනත් පහසුකම් සැපයීම.

(ඊ) සේවා නියුක්තිකයන්ගේ සුභ සාධනය සඳහා විශිෂ්ඨ සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම.

කම්කරු කොමසාරිස් ජනරාල්වරයා, කම්කරු විනිශ්චය සභාවක්, බේරුම්කරුවකු හෝ කම්කරු උසාවියක් හෝ යම් අධිකරණයක් ඉදිරියේ යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ පවරා ඇති හෝ විභාග වෙමින් පවතින යම් සේවා නියුක්තිකයෙකුගේ සේවා නියුක්තිය අවසන් කිරීම හා සම්බන්ධ හෝ කාර්මික ආරාවුලක් සම්බන්ධ නඩු කටයුතු සඳහා සේවා නියුක්තයන්ට නීතිමය සහාය ලබා ගැනීමට මූල්‍යමය සහන සැලසීම.

ශ්‍රම වාසනා අරමුදලේ පාලන ව්‍යූහය

1998 අංක 12 (2019 අංක 15 දරණ සංශෝධිත) දරණ ශ්‍රම වාසනා අරමුදල් පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු අමාත්‍යාංශය යටතේ පවතින අතර එහි සභාපතීත්වය කම්කරු අමාත්‍යාංශයේ ලේකම් සතු වේ. ශ්‍රම වාසනා අරමුදල් පනතට අනුව අරමුදලේ පාලන කටයුතු පිළිබඳ සම්පූර්ණ වගකීම ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති අතර අරමුදල කළමනාකරණය හා ඊට අදාල කටයුතු සියල්ලම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය හා අධීක්ෂණය යටතේ සිදු කරනු ඇත.

2019 වසරේ ශ්‍රම වසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය

නම	තනතුර
ආර්.පී.ආර්. රාජපක්ෂ මහතා	සභාපති
ඒ. විමලවීර මහතා	සාමාජික
එච්.එම් .පී.සී. කුමාරිහාමි මිය	සාමාජික
වී.ජී. විජේසිරි මහතා.	සාමාජික
ඩී.එම්.ගුණසේකර බණ්ඩා මහතා.	සාමාජික
ඊ.ඒ. නාරද එදිරිසිංහ මහතා.	සාමාජික
ඩී.ආර්.ජයලත් මහතා	සාමාන්‍යාධිකාරී/ ශ්‍රම වාසනා අරමුදල

ශ්‍රම වාසනා අරමුදලේ ස්ථාපනය කර ඇති අනු කමිටු

1. අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුව
2. ප්‍රතිලාභ කමිටුව
3. ප්‍රගති සමාලෝචන කමිටුව

අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුව

ශ්‍රම වාසනා අරමුදලේ අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුව ස්වාධීනව ක්‍රියාකරන අංශයක්වේ. මෙම කමිටුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙක්, භාණ්ඩාගාර නියෝජිත, නිරීක්ෂකයන් ලෙස විගණකාධිපතිගේ නියෝජිතයෙකු, රේඛීයව අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිළධාරී, සහ ශ්‍රම වාසනා අරමුදලේ සාමන්‍යාධිකාරී, සහ ගණකාධිකාරී යන සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

මෙම කමිටුවේ මූලික අරමුණ වන්නේ ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු, සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්මේ නිර්ණායක / නිර්දේශ පදනම් කර ගනිමින් අරමුදලේ ආයතනික පාලනය, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ප්‍රවර්ධනය කිරීම ආදී කාර්යන්ට අවශ්‍ය උපදෙස් ලබා දීම. ගිණුම් කටයුතු මෙහෙයවීමේ දී මූල්‍ය ප්‍රකාශන වාර්තාකරණයේ විශ්වසනීයත්වය, වංචා හා අඩුපාඩු වලක්වා ගැනීම,වත්කම් ආරක්ෂා කිරීම වැනි කාර්යන්වලට බලපාන නීති රීති අනුකූලතාවය ආරක්ෂා කරගැනීම පිළිබඳ විමසිලිමත් වීමයි.

අභ්‍යන්තර විගණන කමිටුවේ ප්‍රධානියා / සභාපති සෘජුවම අරමුදලේ සභාපති වෙත වාර්තා කරණ අතර මෙම විගණන වාර්තා විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබයි.

ශ්‍රම වාසනා අරමුදලේ 2019 වසරේ විගණන කමිටුව පහත සාමාජිකයින් ගෙන් සමන්විත වේ

1. එච්.එන්.පී.සී. කුමාරිහාමි මිය,භාණ්ඩාගාර නියෝජිත/ කමිටු සභාපති
2. එම්.වී.කේ.පීරිස් මිය. ප්‍රධාන මූල්‍ය නිලධාරි කම්කරු අමාත්‍යාංශය/කමිටු සාමාජික
3. ඩී.එම්.වී.එච්. ජයතිලක මයා. විගණන අධිකාරි /විගණකාධිපති නියෝජිත/ කමිටු සාමාජික
4. ඩී.ආර්. ජයලත් මය. සාමාන්‍යාධිකාරී ශ්‍රම වාසනා අරමුදල,
5. එම්.එල්.ජයමාලි මිය. ගණකාධිකාරී ශ්‍රම වාසනා අරමුදල,
6. ජී. රූපකරන් මයා, අභ්‍යන්තර විගණක කම්කරු අමාත්‍යාංශය/ කමිටු සාමාජික
7. ඒ.ඩබ්.පී. සිල්වා මයා, අභ්‍යන්තර විගණක- ශ්‍රම වාසනා අරමුදල/ කමිටු සාමාජික

විගණන හා කළමනාකරණ කමිටුවේ මූලික කාර්යයන්

1. ශ්‍රම වාසනා අරමුදලේ පවත්නා ගිණුම් තැබීම සහ වාර්තාකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා එම වාර්තා සමාලෝචනය කිරීම සහ ඇගයීම

2. අරමුදලේ පූර්ව නිශ්චිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කිසියම් ගැටළු පැන නැඟී තිබේ නම් ඒවාට අදාළ බලපෑම් විමර්ෂණය කිරීම.

3. වත්කම් අලාභහානීන් සහ වංචා වලින් ආරක්ෂිතව තිබේ දැයි විශේෂිතව දැන ගැනීම

4 ගණුදෙනුවල අවශ්‍යතාවය හා ගණුදෙනුවල වල ප්‍රතිලාභ විමර්ෂණය කිරීම, නාස්තිය සහ අසාමාන්‍ය ලෙස වැඩිපුර වියදම් කිරීම, වත්කම් ඉවත් කිරීම තුලින් සිදුවන ලාභ පාඩු සහ වියදම් අඩු කිරීම් වාර්තා පිළිබඳව විමර්ෂණය කිරීම.

5. විගණන කමිටු රැස්වීමට පියවර ගැනීම හා විගණන තීරණ සැකසීම අදාළ ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය අංශ ප්‍රධානීන් අතර ඒවා බෙදාහැරීම.

6. විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත වාර්තා ඉදිරිපත් කිරීම.

7. අරමුදලේ සභාපති හෝ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ඉල්ලා සිටින විට විශේෂ විමර්ෂණ පැවැත්වීම.

8. අරමුදලේ සභාපති/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත්කරනු ලබන විවිධ කමිටු වලට සහයවීම හා නිර්දේශ ලබාදීම.

ප්‍රතිලාභ කමිටුව

ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු වලට අනුව සිදුකරන ශිෂ්‍යත්ව ලබාදීම, වෛද්‍යාධාර ලබාදීම, නීති ආධාර ලබාදීම යන වැඩසටහන් වලට අදාල ව ප්‍රතිලාභීන් තෝරා ගැනීම ඒ සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද නිර්ණායක පදනම් කර ගනිමින් ප්‍රතිලාභී කමිටුවක් මගින් සිදු කරයි. මෙම ප්‍රතිලාභ කමිටුව අරමුදලේ සාමාන්‍යාධිකාරී, රේඛීය අමාත්‍යාංශයේ නීති අංශයේ නිලධාරී වරයෙකු, වෘත්තීය රෝග විශේෂඥ වෛද්‍ය වරයකු යන අයගෙන් සමන්විත වේ. නිවැරදි ක්‍රමවේදයකට අනුව ප්‍රතිලාභීන් තෝරා ගැනීමට මෙම කමිටුව උපකාරී වේ.

ප්‍රගති සමාලෝචන කමිටුව

විගණනය විසින් වරින්වර දෙන ලද උපදෙස් අනුව ශ්‍රම වාසනා අරමුදලේ ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත පිහිටුවන ලද කමිටුවකි. ශ්‍රම වාසනා අරමුදලේ දෛනිකව සිදුවන කටයුතු සොයාබැලීම ප්‍රධාන කාර්යය වේ. මෙම කමිටුව අරමුදලේ කළමනාකරු, ගණකාධිකාරී සහ සහකාර කළමනාකරු යන තිදෙනාගෙන් සමන්විත වන අතර, විශේෂයෙන් එදිනෙදා සිදුකරන කටයුතු, නිම කරන ලද ලිපිගොනු සකස්කිරීම, සැලසුම් කරන ලද වැඩ හා සත්‍ය ලෙස සිදු වී ඇති තත්වයන් පිලිබඳ සොයාබලා වැරදි හා අඩුපාඩු මගහරවා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදීම මෙම කමිටුව විසින් සිදු කරයි. අරමුදලේ ලිපිගොනු අඩුපාඩුවලින් තොරව පවත්වා ගෙන යාමට හා වැඩසටහන් ක්‍රමවත්ව සිදුකිරීමට මෙම කමිටුව පිටිවහලක් වී ඇත.

විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කරන ලද කරුණු හා ගන්නා ලද ක්‍රියා මාර්ග තීරණ -

පළමු කාර්තුව

අනු අංකය	සාකච්ඡා කරන ලද කරුණ	තීරණය	ගන්නා ලද ක්‍රියා මාර්ග
01	ශ්‍රම වාසනා අරමුදල සඳහා අභ්‍යන්තර විගණකවරයෙක් පත් කර ගැනීම.	ශ්‍රම වාසනා අරමුදලේ අභ්‍යන්තර විගණක තනතුර මේ වන විට පුරප්පාඩු වී ඇති බැවින් එම පුරප්පාඩුව සපුරා ගැනීම සඳහා කම්කරු දෙපාර්තුමේන්තුවේ නිළධාරියෙන් පත් කර ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම් විසින් මේ වන විට දන්වා එවා ඇති බව සාමාන්‍යාධිකාරී විසින් ප්‍රකාශ කරන ලදී. එතෙක් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් ශ්‍රම වාසනා අරමුදලේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම වඩා යෝග්‍ය බව විගණන අධිකාරි විසින් ප්‍රකාශ කරන ලදුව ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් එකඟතාව පළ කරන ලදී.	නව අභ්‍යන්තර විගණකයකු වශයෙන් කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ පළමුවන ශ්‍රේණියේ ගණකාධිකාරිවරයකු පත් කර මේ වන විට අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ඇත.
02	2019 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරි සැලැස්ම හා අය වැය ලේඛනය	2019 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරි සැලැස්ම හා අය වැය ලේඛනය සැප්තැම්බර් මස 15 වන දිනට පෙර භාණ්ඩාගාරය වෙත යවා ඇති බව ශ්‍රම වාසනා අරමුදලේ සාමාන්‍යාධිකාරී විසින් කමිටුවට දන්වා සිටින ලදී.	ශ්‍රම වාසනා අරමුදලට අදාලව පිළියෙල කරනු ලැබූ 2019 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරි සැලැස්ම හා අය වැය ලේඛනය සැප්තැම්බර් මස 15 වන දිනට පෙර භාණ්ඩාගාරය වෙත යවා ඇත.
03	අභ්‍යන්තර විගණන සැලැස්ම 2019	අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා පවත්වාගෙන යාම ආයතනයේ වගකීම බවත්, එය විගණන පනත මගින් සඳහන් කර ඇති බව රජයේ විගණන අධිකාරී විසින් ප්‍රකාශ කරන ලදී.	2019වර්ෂයේ දෙවන හා තුන්වන කාර්තු සම්බන්ධයෙන් සකසන ලද අභ්‍යන්තර විගණන සැලැස්ම ඉදිරිපත් කරන ලදී .මූල්‍ය විගණනයට වඩා පද්ධති විගණනයට වැඩි අවදානයක් යොමු කරමින් අභ්‍යන්තර විගණන සැලැස්ම සංශෝධනය කර පවත්වා ගෙන යනු ලබයි.
04	Web base system	ශ්‍රම වාසනා අරමුදල Web base පද්ධතිය සිදු කිරීමේ ප්‍රගතිය පිළිබඳව භාණ්ඩාගාර නියෝජිත විසින් විමසන ලදුව Web base stage 3 දක්වා අවසන් කර ඇති බව සාමාන්‍යාධිකාරී විසින් ප්‍රකාශ කරන ලදී.	2019 වර්ෂය අවසාන වන විට පද්ධතියේ අදියර තුනක් අවසන් කොට ඇති අතර ආයතනයේ කටයුතු පරිසණක මෘදු කාංග භාවිතයෙන් සිදු කරගැනීමට පහසුකම් ලැබී ඇත.

05	ශ්‍රම වාසනා අරමුදලේ 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන	මූල්‍ය ප්‍රකාශනයෙහි සඳහන් පරිගණක උපාංග මිලදී ගැනීමේ සහ ප්‍රත්‍යාගණනය සිදු කිරීමත්,ඒ සඳහා කමිටු පත් කර ගැනීම පිළිබඳවත්, ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් විමසා සිටින ලදී. වාර්ෂික ගිණුම් සකස් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති භාවිතා කළ යුතුද නැතහොත් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති භාවිතා කළ යුතු දැයි සාමාන්‍යාධිකාරි විසින් විමසන ලදී. ශ්‍රම වාසනා අරමුදල සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිත භාවිතා කළ යුතු බවත්, ප්‍රමිති වලට අනුව ආයතනයේ ප්‍රතිපත්තීන් සකසා ගෙන එය ගිණුම් වාර්තා වල හෙළිදරව් කළ යුතු බව විගණන අධිකාරී පවසා සිටින ලදී. ගිණුම් වාර්තා තුළ රු.5000ට අඩු ප්‍රාග්ධන ස්වභාවයේ ගනුදෙනු ප්‍රාග්ධනිත නොකළ යුතු බවත් ඒවා අයභාර ස්වභාවයේ වියදම් ලෙස හඳුනා ගත යුතු බවට චක්‍ර ලේඛයක් නිකුත් කර ඇති බවත් එම නිසා තොගය තුළ පමණක් ඇතුළත් කිරීම ප්‍රමාණවත් වන බව රජයේ විගණන අධිකාරී පවසා සිටින ලදී.	නව රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳ ආයතනයේ විෂයභාර නිලධාරීන් පුහුණු කිරීම තුලින් අඩුපාඩු නිවැරදි කර නිවැරදි ගිණුම් වාර්තා පවත්වා ගෙන යනු ඇත.
06	ලිපි ගොනු සකස් කිරීම	ශ්‍රම වාසනා අරමුදල මගින් සිදු කරනු ලබන සියලු වැඩසටහන් වල ලිපි ගොනු සකස් කිරීමේ ප්‍රමාදයක් ඇති බව විගණක අධිකාරී පවසන ලදී. ලිපි ගොනු සැකසීමේ කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාම සඳහා ප්‍රගති සමාලෝචන කමිටුවක් පිහිටුවා එමගින් අධීක්ෂණ කටයුතු සිදු කිරීම සහ එහි වාර්තා මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කරන බව සාමාන්‍යාධාකාරී විසින් කමිටුව වෙත දැනුම් දෙන ලදී.	ප්‍රගති සමාලෝචන කමිටුව පිහිටුවා එමගින් අධීක්ෂණ කටයුතු සිදු කිරීම සහ එහි වාර්තා මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කිරීම මගින් සියලු වැඩසටහන් වල ලිපි ගොනු පිළියෙල කිරීමේදී සිදු වන වැරදි අඩුපාඩු නිවැරදි කර ගැනීම මේ වන විට කටයුතු සිදු කර ඇත.
07	වැඩසටහන් සිදු කිරීම	සංයුක්ත සැලැස්මට අනුව වැඩසටහන් සිදු කිරීමේදී දිවයින පුරා වැඩසහන් සැලසුම් කිරීම සිදු විය යුතු බව විගණන අධිකාරී වරයා පවසන ලදි.	පස් අවුරුදු සංයුක්ත සැලැස්මට අනුව සිදු කරනු ලබන වැඩසටහන් අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර අධ්‍යක්ෂ මණ්ඩලය මගින් තීරණය කරනු ලබන වැඩසටහන් දීප ව්‍යාප්තව සිදු කරීමට කටයුතු කරනු ලැබේ.

08	වැඩසටහන් සිදු කිරීම	අත් පා ලබා දීමේ වැඩසටහන් වලදී ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු ලගා කර ගැනීම නිවැරදිව සිදු වේද යන්නත් එහිදී වෛද්‍ය පරීක්ෂාවන් සිදු කර නිවැරදි පුද්ගලයින් හට අත් පා ලබා දීම සිදු වන්නේද යන්න විගණන අධිකාරී විසින් විමසන ලදී. මෙතෙක් ලබා දෙන අත් පා ලබා දෙන ලද්දේ වෛද්‍ය පරීක්ෂාවන් සිදු කර නිවැරදි ප්‍රතිලාභීන්ට බවත්,ඉදිරියේදී පත්තර දැන්වීම් පල කර ආයතන ලියාපදිංචි කිරීම මගින් තෝරා ගනු ලබන ආයතනය වෙත වාරික දෙකකින් මුදල් ලබා දීමට තීරණය වී ඇති බව සාමාන්‍යාධිකාරී ප්‍රකාශ කරන ලදී. සවිබල ගැන්වීමේන්වීමේ වැඩසටහන් වලදී භාණ්ඩ ප්‍රතිලාභීන් හට ලබා දීමේදී විධීමත් ක්‍රම වේදයක් භාවිතා කරමින් නිවැරදිව ප්‍රතිලාභීන් හට ඒවා භාරදිය යුතු බවද විගණන අධිකාරී විසින් ප්‍රකාශ කරන ලදී.	පෙර පැවති කෘතීම අත් පා ලබා දීමේ වැඩසටහනෙහි පැවති තාක්ෂණික දෝෂ හේතු වෙන් එය නවතා දමා වර්තමානය වන විට පත්තර දැන්වීම් පල කර කෘතීම අත් පා ලබාදෙන ආයතන ලියාපදිංචි කිරීම මගින් තෝරා ගනු ලබන ආයතනය වෙත වාරික දෙකකින් මුදල් (රු.50000/- උපරිමයක යටත් ව)ලබා දීමට කටයුතු සිදු කරනු ලැබේ.

දෙවන කාර්තුව

අනු අංකය	සාකච්ඡා කරන ලද කරුණ	තීරණය	ගන්නා ලද ක්‍රියා මාර්ග
01	2018 වර්ෂයේ විගණාධිපතිගේ අවසාන විගණන වාර්තාව	2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ විගණකාධිපති විසින් තත්වාගණනය කරන ලද මතයක් ප්‍රකාශ කර ඇති බව විගණන අධිකාරී විසින් ප්‍රකාශ කරන ලදී. එනම් එහි සඳහන් කරුණු කිහිපයකට යටත්ව මූල්‍ය ප්‍රකාශන නිවැරදි බව ප්‍රකාශ කරන ලදී.	අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් වලට අනුව නිවැරදි කර ගත යුතු ස්ථාන නිවැරදි කර ගනිමින් ආයතන සංග්‍රහය මුදල් රෙගුලාසි ප්‍රසම්පාදන මාර්ගෝපදේෂනය අනුව යමින් ආයතනය පවත්වා ගෙන යනු ඇත.
02	ලොතරැයි ආදායම	2019 වර්ෂය තුල දී ලොතරැයි ආදායම අඩු වී ගෙන යන බව විගණන අධිකාරී ප්‍රකාශ කරන ලදී. මෙහි දී සාමාන්‍යාධිකාරී ප්‍රකාශ කරන ලද්දේ අප්‍රේල් මාසයේ දී ඇතිවූ කල බල හේතුවෙන් ආදායම අඩු වී ඇති බවයි. එය නැවත වැඩි වී ගෙන යන බවයි.	අධ්‍යක්ෂ මණ්ඩලය සමග සාකච්ඡා කර ඉදිරියේදී ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරන ලදී.

03	ක්‍රියාකාරී සැලැස්ම	ආයතනයක ක්‍රියාකාරී සැලැස්ම අනුව වැඩසටහන් සිදුකළ යුතු බවත් ඉන් වෙනස් වන්නේ නම් ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතු බවත් විගණනාධිකාරි ප්‍රකාශ කරන ලදී. එහිදී ක්‍රියාකාරී සැලැස්මට අනුව සියළු වැඩසටහන් සිදුකර ඇති බවත් ප්‍රගතිය අඩු වැඩසටහන් වලට වැඩි අවධානය යොමු කර තීරණයක් ගත යුතු බව සාමාන්‍යාධිකාරී ප්‍රකාශ කරන ලදී.	ඒ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලැබූ කමිටුවක් මගින් කමිටු වාර්තා වලට අනුව ඉදිරි වැඩසටහන් සැලසුම් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර ඇත.
04	මානව සම්පත් කළමනාකරණය	මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් 2018 වර්ෂයේ නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව 2019 වර්ෂයේ දී කටයුතු සිදුකල යුතු බව විගණනාධිකාරී ප්‍රකාශ කරන ලදී.	2019 වර්ෂය සඳහා මානව සංවර්ධන සැලැස්මක් සකස් කොට අදාල කටයුතු සිදු කර ඇත.

තෙවන කාර්තුව

අනු අංකය	සාකච්ඡා කරන ලද කරුණ	තීරණය	වගකිව යුතු නිළධාරියා
01	වත්කම් තත්වාගණනය කිරීම	2018-12-31 දිනෙන් අවසන් වර්ෂයේ විස්තරාත්මක විගණන වාර්තාවෙන් රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 07 ට අනුව අදාල ස්ථාවර වත්කම් අයිතමය වෙනුවට අදාල වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කල යුතු බව විගණන අධිකාරී විසින් ප්‍රකාශ කරන ලදි . මෙය ඊළඟ වර්ෂයේදී නිවැරදි කළ යුතු බව මුදල් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂතුමිය විසින් ප්‍රකාශ කරන ලදී.	මේ වන විට නව ප්‍රමිතින්ට අනුව වත්කම් පන්තියම ත්‍යාගණනය කොට ඇත.
02	පාරිතෝෂිත සඳහා වෙන්කිරීම්	පාරිතෝෂිත සඳහා වෙන්කිරීමේ දී මූලික වැටුප පමණක් පදනම් කර ගෙන ඇති බව විගණනාධිකාරී ප්‍රකාශ කරන ලදී .මෙහිදී කම්කරු කොමාසාරිස් නිකුත් කල චක්‍රලේඛයට අනුව වන වැටුප මත පාරිතෝෂික ගණනය කල යුතු බව ප්‍රකාශ කරන ලදී.	පාරිතෝෂිත සඳහා වෙන් කිරීමේදී කම්කරු කොමාසාරිස් නිකුත් කල චක්‍රලේඛයට අනුව වන වැටුප මත පදනම්ව පාරිතෝෂික වෙන් කිරීම සිදු කර ඇත.

03	මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කිරීම්	රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව ආයතනයට විරුද්ධව පවරා ඇති නඩු පිළිබඳ හෙළිදරව් කිරීම් කල යුතු බව විගණන අධිකාරී විසින් ප්‍රකාශ කරන ලදී.	2013 වර්ෂයේ ශ්‍රම වාසනා අරමුදලේ සේවය කරනු ලැබූ කළමනාකරණ සහකාර මදුෂංක සහ ලඝු ලේඛිකා දුෂ්මන්තා පියදාස යන දෙදෙනා සිදු කරනු ලැබූ විනය විරෝධී ක්‍රියාවක් හේතුවෙන් 2016 දී විධිමත් පරිදි සේවයෙන් පහ කරන ලදී.ඔවුන් විසින් කම්කරු විනිශ්චය සභාවේ පවරනු ලැබූ පැමිණිල්ලට අනුව බොරැල්ල කම්කරු විනිශ්චය සභාවේ උක්ත නඩුව මේ වන විට සිදු වෙමින් පවතී.
04	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම	ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කර ඇති සමහර වැඩසටහන් ක්‍රියාත්මක වී නොමැති බව විගණන අධිකාරී ප්‍රකාශ කරන ලදී .එහි දී ඒවා අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු බව ප්‍රධාන මූල්‍ය නිලධාරී මිය විසින් ප්‍රකාශ කරන ලදී.	වරින් වර විගණන හා කළමණාකරණ කමිටු රැස්වීමේදී හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මේ පිළිබඳ සාකච්ඡා කර සංශෝධනය කරමින් වැඩසටහන් සිදු කරමින් පවතී.

සිව්වන කාර්තුව

අනු අංකය	සාකච්ඡා කරන ලද කරුණු	තීරණය	වගකිව යුතු නිළධාරියා
<u>ශ්‍රම වාසනා අරමුදල් පනත සංශෝධනය</u>			
01	ශ්‍රම වාසනා අරමුදල් පනත සංශෝධනය කිරීම	ශ්‍රම වාසනා අරමුදල් පනතේ සංශෝධනයන් අනුමත වූ බව සාමාන්‍යාධිකාරී විසින් ප්‍රකාශ කරන ලදී . මෙහිදී නව සංශෝධනයන් මොනවාද යන්න සෙසු සාමාජිකයින් විසින් විමසා සිටින ලදී. ශ්‍රම වාසනා පනතට අනුව ලොතරැයිය “ශ්‍රම වාසනා” යන නමින් තිබිය යුතුය. වර්තමානයේ එය “ජාතික සම්පත” නමින් නිකුත් කරයි. නව සංශෝධනයට අනුව ඕනෑම නමකින් නිකුත් කළ හැකි බව සාමාන්‍යාධිකාරී ප්‍රකාශ කරන ලදී. පනතට අනුව නීති ආධාර සැපයිය යුත්තේ “සේවා යෝජකට” බව සඳහන්ව ඇත. නමුත් නීති ආධාර සැපයිය යුත්තේ සේවකයාට වන නිසා එය “සේවකයාට” යනුවෙන් සංශෝධනය කළ බව සාමාන්‍යාධිකාරී ප්‍රකාශ කරන ලදී. ලොතරැයියේ අලෙවිය වැඩි කර ගැනීම සඳහා අලෙවි ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් පනතට අනුව මුදල් වියදම් කළ නොහැකි වූ අතර නව සංශෝධනයට අනුව ප්‍රචාරණ කටයුතු සඳහා මුදල් වියදම් කල හැකි වන සේ පනත සංශෝධනය කළ බව සාමාන්‍යාධිකාරී පවසන ලදී.	සංශෝධනයට අවශ්‍ය කෙටුම්පත මේවන විට නීතිපති දෙපාර්තමේන්තුවට යවා ඇති අතර අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

2019 12-31- දිනට සංවිධාන සටහන



ශ්‍රම වාසනා අරමුදල සඳහා ලැබීම්

(අ) පාර්ලිමේන්තුව විසින් අරමුදලේ අරමුණු ඉටු කර ගැනීමේ කාර්යය සඳහා කලින් කළ සම්මත කරනු ලැබිය හැකි සියළු මුදල්

(ආ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ප්‍රධාන, ත්‍යාග හෝ පරිත්‍යාග වශයෙන් ලැබෙන සියළුම මුදල්

(ඇ) අරමුදල මඟින් සිදු කරනු ලබන ආයෝජන වලින් ආදායම වශයෙන් ලැබෙන මුදල්

(ඈ) 13 වන වගන්තියේ සඳහන් ලොතරැයි වලින් ලැබෙන මුදල් ද ඇතුළුව මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී අරමුදල වෙත ලැබෙන සියළුම මුදල්

ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය (රුපියල් මිලියන වලින්)

වර්ෂය	2013	2014	2015	2016	2017	2018	2019
අරමුදලේ වටිනාකම	292	331	369	381	393	408	427
අරමුදලේ වර්ධනය	58	39	38	12	12	15	19



ලොතරැයි ආදායම (රුපියල් මිලියන වලින්)

වර්ෂය	2013	2014	2015	2016	2017	2018	2019
ආදායම	63	59	62	65	46	52	60
ආදායම වර්ධනය	14	-4	3	3	-19	6	8



මූල්‍ය / කාර්ය සාධන සමාලෝචනය

ආදායම් සංසන්දනය.



	2015	2016	2017	2018	2019
ලොතරැයි ආදායම	62,609,140	65,101,330	46,038,539	51,766,720	60,221,340
ස්ථාවර තැන්පතු පොළී	2,624,822	3,113,002	11,778,989	11,104,892	12,889,709
වෙනත්	164,379	294,836	110,293	370,109	135,408

මුළු වියදම් සංසන්දනය.



	2015	2016	2017	2018	2019
පරිපාලන වියදම්	7,109,721	8,952,149	12,609,705	13,931,486	15,849,845
අරමුණුගත වියදම්	18,829,460	30,267,660	30,178,504	28,071,637	32,556,007

වත්කම් සංසන්දනය.



	2015	2016	2017	2018	2019
ජංගම වත්කම්	335,080,431	334,144,880	420,048,160	417,604,915	439,140,324
ජංගම නොවන වත්කම්	38,410,914	65,366,394	117,741,684	13,836,958	15,937,138

මුළු වගකීම් සංසන්දනය



	2015	2016	2017	2018	2019
ජංගම වගකීම්	3,551,416	1,307,231	8,688,537	2,910,902	2,081,149
සමුච්චිත අරමුදල	369,939,929	398,204,043	411,359,622	428,530,971	452,996,323

ශ්‍රම වාසනා අරමුදලේ 1998 – 2019 විශේෂ අවස්ථා

1998 මාර්තු 31 වන දින ශ්‍රම වසනා අරමුදල ආරම්භ කල අතර සාමාන්‍යාධිකාරී හා කාර්යය මණ්ඩලයේ තිදෙනෙකු ගෙන් සැදුම් ලත් ඉතා අඩු කාර්යය මණ්ඩලයක් මගින් සියලු කටයුතු කරගෙන යන ලදී. මෙසේ 2010 වසර පමණ වන තෙක් ඉතාම අඩු පහසුකම් මත බොහෝ දුෂ්කරතා මධ්‍යයේ අරමුදලේ කටයුතු සිදුකරන ලදී.

2010 වසරේ සිට අරමුදලේ සේවාවන් පෙරට වඩා මුළු දිවයිනම ආවරණය වන පරිදි පවත්වාගෙන යාම අරමුණු කර නව කාර්යය මණ්ඩලය බඳවා ගැනීම, අරමුදලට අවශ්‍ය සම්පත් මිලදී ගැනීම, සේවක පුහුණුව හා සංවර්ධන වැඩසටහන් පවත්වා ඔවුන් යාවත්කාලීන කිරීම නිරන්තර ව සිදු කරන ලදී, "ශ්‍රම වාසනා ක්ෂණික" ලොතරැයිය "ජාතික සම්පත-සෙනසුරාදා" ලෙස දිනුම් අදිනු ලබන ලොතරැයියක් ලෙස වෙනස් කිරීම හා ලොතරැයි ප්‍රවර්ධන කටයුතු පුළුල් කිරීම තුලින් ලොතරැයි අලෙවිය වැඩිවීම මත අරමුදලේ අරමුණු සාක්ෂාත් කරගැනීමේ ප්‍රතිශතය ඉහල යන ලදී.

අරමුදල හා එහි කාර්යයන් ප්‍රතිලාභීන් අතරට රැගෙන යාම සඳහා දිස්ත්‍රික් කම්කරු කාර්යාල හා කම්කරු ඉංජිනේරු කාර්යාල හා එක්ව කටයුතු කල අතර, අරමුදලේ කාර්යන් ඇතුලත් දැන්වීම් ලංකාවේ සියලුම කම්කරු විනිශ්චය සභා, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ප්‍රදර්ශනය කරන ලද අතර මේ තුලින් අරමුදල පිලිබඳ ජනතාව දැනුවත් වූ අතර එය ලොතරැයි අලෙවිය වැඩිවීමට ද හේතු විය.

අරමුදලේ අරමුණු වලට අනුව කටයුතු සිදුකරන අතර වඩාත් ඵලදායි ලෙස සේවා සැපයීම අරමුණු කර කම්කරු අමාත්‍යාංශය යටතේ පැවති ආයතන අතුරින් ආයතනයක් හිමිකරගත් පළමු ISO ජාත්‍යන්තර තත්ත්ව සහතිකය 2018 වසරේ ශ්‍රම වාසනා අරමුදල හිමි කරගන්නා ලදී.

ආයතනික කටයුතු පුළුල් කරමින් බොහෝ කාර්යයන් පහසුවෙන් හා කඩිනමින් සිදුකර ගැනීම සඳහා පරිගණක ගත ක්‍රමවේද අනුගමනය කරමින් මාර්ග ගත (Online System) ක්‍රමයට නිලධාරීන්ට තම රාජකාරී සිදු කිරීමටත්, ප්‍රතිලාභීන්ට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමටත් අවශ්‍ය පරිගණක ගත වැඩ පරිසරයක් (Computer BaseWorking Environment) ශ්‍රම වාසනා අරමුදල තුළ ස්ථාපනය කර ඇත. එසේම Digital Recording System භාවිතා කරමින් ඉතා කඩිනමින් ප්‍රතිලාභීන්ට තොරතුරු ලබාදීමද දැනටමත් සිදු කරයි.

ඉදිරි වසර තුල ජාතික ඵලදායිතා තරගාවලියට ඉදිරිපත් වීමට සහ 5-S සංකල්පය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර ඒ තුලින් අරමුදලේ කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායිව සිදුකිරීම අරමුණ වේ.



පරිගණක ගත තොරතුරු පද්ධතිය.



ISO ජාත්‍යන්තර තත්ව සහතිකය ලබාගැනීම.

ශ්‍රම වාසනා අරමුදලේ අභියෝග හා සාමාජීය වගකීම්

ශ්‍රම වාසනා අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වන සෙනසුරාදා දිනුම් අදින "ජාතික සම්පත" ලොතරැයිය හා තරඟකාරීව තවත් ලොතරැයි ක්‍රියාත්මක වීමත්, එවැනි විවිධ ලොතරැයි තුලින් පිරිනමන ප්‍රථම ත්‍යාග මුදලේ වටිනාකම ඉතා ඉහල අගයක් ගැනීම වැනි හේතුවෙන් එවැනි ලොතරැයි වලට සාපේක්ෂව 'ජාතික සම්පත" ලොතරැයි ටිකට් පත් අලෙවිය අඩු මට්ටමක පවතී. මෙම තත්වය අරමුදලේ වර්ධනයට අහිතකර ලෙස බලපාන බැවින් ලොතරැයි අලෙවිය වැඩි කර ගැනීම සඳහා ප්‍රචාරණ හා අලෙවි ප්‍රවර්ධන කටයුතු වැඩි කිරීමට තීරණය කර ඇත. එසේම පාරිභෝගිකයන්ට ටිකට් පත් අන්තර්ජාලය හරහා මිලදී ගැනීමට හැකිවන පරිදි පහසු ක්‍රම වේදයන් සැලසුම් කිරීම පිළිබඳව ද සාකච්චා කරමින් පවතී. ඉදිරියේදී ලොතරැයි ආදායම මත ම පදනම් නොවී විදේශීය ආධාර හා ප්‍රධානයන් ලබා ගැනීම කෙරෙහි ද අවධානය යොමු කර ඇත.

1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනත 2019 අංක 15 ලෙස සංශෝධනය මෙම වසර තුලදී සිදු කල අතර ඒ නිසා වැඩසටහන් සැලසුම් කිරීමේ දී තිබූ ගැටලුකාරී තත්වයන් අවම කර ගැනීමට හැකිවූ අතර ම විශේෂයෙන් සේවානියුක්තයන්ගේ යැපෙන්නන් ද ප්‍රතිලාභීන් ලෙස සලකා අරමුදලේ ප්‍රතිලාභ, සේවා නියුක්තයන්ගේ පවුල් ආවරණය වන ලෙස ලබා දීමේ හැකියාව ඇති විය. මෙම සංශෝධනය මගින් ලොතරැයි අලෙවි ප්‍රවර්ධනය හා ප්‍රචාරණ කටයුතු සිදුකිරීමට ශ්‍රම වාසනා අරමුදලට ද බලතල ලැබී තිබේ.

සමාජීය හා පාරිසරික වගකීම්

කර්මාන්තශාලා /ආයතන තුල සිදුවන ව්‍යක්තීය අනතුරු හේතුවෙන් අසරණ වන හෝ මරණයට පත්වන සේවක සේවිකාවන්ගේ අධ්‍යාපනය ලබන දරුවන් හට ශිෂ්‍යත්ව ලබාදීම සිදුකරන අතරම මෙවැනි අනතුරු පිළිබඳව පූර්ව අවධානය යොමුකොට ඒවා වලක්වා ගැනීම සඳහා අවධානම් සහිත කර්මාන්තශාලා හඳුනාගෙන ව්‍යක්තීය අනතුරු අවම කරගැනීම පිලිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් දීප ව්‍යාප්තව සිදු කරයි. මෙම හේතුව නිසා ම පසු ගිය වසර කිහිපය තුල කාර්මික අනතුරු වල යම් අඩුවක් හා කාර්මික මරණ ප්‍රමාණයේ අඩු වීමක් සිදුවී ඇති බවත්, ආයතන තුල අනතුරු අවම කරගැනීම පිලිබඳ සංස්කෘතියක් වර්ධනය වීමත් වාර්තා වී ඇත.

බෝනොවන රෝග පිලිබඳ සෞඛ්‍ය වැඩමුළු පැවැත්වීම හා සේවක සේවිකාවන් වෙනුවෙන් ඇස් කණ්නාඩි ලබාදීම වැනි වැඩසටහන් තුලින් සේවක අභිප්‍රේරණය ඇතිවීම නිසා ඔවුන්ගේ සේවාවන් වඩාත් ඵලදායිව යොදාගැනීමට හැකි වූ බව සේවා හා සේවක යන දෙපාර්ශවය විසින්ම තහවුරු කර ඇති බව ඊට අදාල ප්‍රතිපෝෂණ ආකෘති තුලින් පැහැදිලි වේ.

ජාතික රුක් රෝපණ දිනයට සමගාමීව "ගෝලීය උණුසුම අවමකර ගැනීම සඳහා රුක් රෝපණයේ ඇති වැදගත්කම" පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී. ශ්‍රම වාසනා ආයතන පරිශ්‍රය තුල රුක් රෝපණයට පරිසරයක් නොමැති තත්වය තුල කාර්යය මණ්ඩලයේ සියලු දෙනාගේ ගෙවතුවල රුක්රෝපනය සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදී.

ශ්‍රම වාසනා අරමුදලේ වැඩසටහන් සමාලෝචනය

ශ්‍රම වාසනා අරමුදල පෞද්ගලික අංශයේ සේවකයන් ආවරණය වන පරිදි පිහිටුවා ඇති අතර ස්වයං රැකියාවන් හි නිරත පිරිස මෙමඟින් ආවරණය නොවේ. ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය ධාරිතාව මත විවිධ වැඩසටහන් එක් එක් සීමාවන් තුල ක්‍රියාත්මක කරනු ලැබේ. මූල්‍ය ධාරිතාව වැඩිවීමත් සමඟ එම සීමා වලින් ඔබ්බට තව දුරටත්සේවාවන් පුළුල් කිරීම වසරින් වසර සිදු කරමින් පවතී.

ශ්‍රී ලංකාව තුල පැවති අභ්‍යන්තර ගැටුම් නිමවීමත් සමඟ වර්තමානයේ ඇති වී ඇති දේශපාලන ස්ථාවර භාවයත්, ශ්‍රී ලංකාව හා ජාත්‍යන්තර ප්‍රජාව අතර ඇති වී තිබෙන අන්තර් සම්බන්ධතා පුළුල් වීමත් හේතුකොට ගෙන රට තුළ ඇති වූ සාමකාමී වාතාවරණය හේතුවෙන් විදේශ ආයෝජන විශාල ප්‍රමාණයක් ශ්‍රී ලංකාව තුළ වර්ධනය වී ඇත.

මෙමඟින් ලංකාව තුළ වැඩි වැඩියෙන් කර්මාන්තශාලා ආරම්භවීමත් එනිසාම වැඩි පිරිසකට රැකියා අවස්ථා හිමිවීමත් සිදු වූ අතර එම හේතු නිසා වර්තමානය වන විට ලංකාවේ ක්‍රියාකාරී ශ්‍රම බලකාය මිලියන 9ක් පමණ වේ. මෙසේ වැඩිවන ශ්‍රම බලකාය ඉලක්ක කරමින් ශ්‍රම වාසනා අරමුදල විසින් විවිධ අරමුණු ඔස්සේ ක්‍රියාත්මක කරන වැඩසටහන් ප්‍රමාණය ද වසරින් වසර වැඩිකරමින් සේවක සුභ සාධනය ඉහළ නැංවීමට කටයුතු කරගෙන යනු ලබයි.

2019 වසරේ අප්‍රේල් මස 21 වනදින (පාස්කු දින) අප රටේ ඇති වූ අවාසනාවන්ත ත්‍රස්තවාදී ප්‍රහාරය හේතුවෙන් ලොතරැයි ආදායම යම් අඩුවක් සිදු විය. එසේම සංයුක්ත සැලැස්මට අනුව 2019 වසර වෙනුවෙන් සැලසුම් කර තිබූ සමහර වැඩ සටහන් පැවති ආරක්ෂක තත්වයන් යටතේ නියමිත මට්ටමින් ම ඉටු කර ගැනීමට අපහසු විය.

කෙසේ නමුත් ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා අනුව සැලසුම් කර තිබූ අය වැය සීමාවන් තුළ අරමුදලේ කටයුතු උපරිමයෙන් ඉටුකර ගැනීමට කටයුතු කල අතර ඒ තුළින් අරමුදලේ කටයුතු යම් තාක් දුරකට සපුරා ගත හැකි විය.



ශ්‍රම වාසනා අරමුදල වාර්ෂිකව සිදුකරන ප්‍රධාන වැඩසටහන් කිහිපයක්.

2019 වසරේ ශ්‍රම වාසනා අරමුදල විසින් සිදුකල වැඩ සටහන් ප්‍රධාන අංශයන් කිහිපයක් යටතේ පෙළගැස්විය හැකිය

- දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, (වෘත්තීය අනතුරු අවම කිරීමේ හා වෙනත්)
- අඩු ආධායම් ලාභී කම්කරු පවුල් වල සාමාජිකයින් සවිබල ගැන්වීම.
- වෛද්‍ය කඳවුරු පැවැත්වීම - (අක්ෂි සායන)
- අඩු ආධායම් ලාභී කම්කරු පවුල් හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ අධ්‍යාපනය ලබන දරුවන් වෙනුවෙන් පාසල් උපකරණ ලබාදීම.
- වෘත්තීය අනතුරු හේතුවෙන් මියගිය සේවකයින්ගේ දරුවන් වෙත ශ්‍රම වාසනා ශිෂත්ව පිරිනැමීම.
- අසාධාරණ ලෙස සේවයෙන් ඉවත්කළ සේවකයින් සඳහා නීති ආධාර ලබාදීම.
- වෘත්තීය රෝග වලින් පීඩාවට පත් සේවක සේවිකාවන්ට වෛද්‍ය ආධාර ලබාදීම.
- සේවකයින්ගේ සුබ සාධනය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
- මීට අමතරව කාර්යක්ෂම හා ඵලදායී සේවයක් ලබා දීමේ අරමුණින් ශ්‍රම වසනා අරමුදලේ කාර්යය මණ්ඩලය නිරන්තර පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීමට කටයුතු කරන ලදී.

1. දැනුවත් කිරීමේ වැඩසටහන්

දළ විශ්ලේෂණය.

ශ්‍රම වාසනා අරමුදල පිහිටුවීමේ මූලික අරමුණ අතර සේවා නියුක්තිකයන්ගේ සුබසාධනය ප්‍රවර්ධනය කිරීම ප්‍රමුඛ වේ. පසුගිය වසර කිහිපය දෙස බලන විට ලංකාවේ සිදුවන කාර්මික අනතුරු වලින් බොහෝ ප්‍රමාණයක් සේවක සේවිකාවන්ගේ නොසැලකිලිමත් බව, ආරක්ෂක උපකරණ භාවිතයට නැඹුරු නොවීම වැනි හේතු තුලින් සිදු වී ඇති බව පැහැදිලි විය.

මෙම හේතු නිසා අනතුරු වැලැක්වීමේ පූර්ව සූදානමක් ලෙස පසුගිය වසර වල අනතුරු වාර්ථා වී ඇති හා අවධානම් තත්වයන් ඇති කර්මාන්තශාලා හඳුනාගෙන ආරක්ෂිතව වැඩ කිරීම පිළිබඳ පුහුණු වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ඒ පිළිබඳව දැනුමක් ඇති ඉංජිනේරුවරුන් මාර්ගයෙන් සිදු කරන ලදි.

එසේම කම්කරු නීති අණපනත් පිළිබඳව සේවක සේවිකාවන් මෙන්ම ආයතන හිමිකරුවන්ට පැන නගින ගැටළුකාරී තත්වයන් පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් ක්ෂේත්‍රයේ පළපුරුදු සම්පත් දායකවරුන් මාර්ගයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරන ලදි.

මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් ඉතා සාර්ථක වී ඇති අතර වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින් කාර්මික අනතුරු අවම කර ගැනීමටද හැකියාව ලැබී ඇත.



(විස්තර සඳහා ඇමුණුම - පිටු අංක 61-62)



ශ්‍රම වාසනා දැනුවත් කිරීමේ වැඩසටහන 2019 ජනවාරි මස 29 දින එමරල්ඩ (පුද්.) සමාගම



අධි අන්තරාදායි පීඩන යන්ත්‍ර පරීක්ෂා කිරීම පිළිබඳ සහතික ලත් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන.

2. සවිබල ගැන්වීමේ වැඩසටහන්

දළ විශ්ලේෂණය.

මෙය විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී කම්කරු පවුල් සවිබල ගැන්වීම අරමුණ කරගෙන සිදුකරයි. වසරින් වසර ලංකාවේ එක් එක් පළාත් ආවරණය වන ආකාරයට ලංකාවම ආවරණය වන පරිදි මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර කම්කරු පවුල් වල ආර්ථිකය ශක්තිමත් කිරීමට අඩු ආදායම්ලාභී එක් පවුලකින් එක් අයෙකු බැගින් තෝරා ඔවුන් කැමති අංශයකින් හෝ ඔවුනේගේ ප්‍රදේශයට ගැළපෙන අංශයක් යටතේ ස්වයං රැකියා සඳහා පුහුණුවක් ලබා දී එම කර්මාන්ත පවත්වාගෙන යාමට අවශ්‍ය උපකරණ කට්ටල ලබා දීම සිදු කරනු ලබයි.



(විස්තර සඳහා ඇමුණුම - පිටු අංක 61-62)



සවිබල ගැන්වීමේ වැඩසටහන කෑගල්ල ප්‍රාදේශීය රබර් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය.



සවිබල ගැන්වීමේ වැඩසටහන ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - පදවිය.



සවිබල ගැන්වීමේ වැඩසටහන උණවටුන වැටකේ පන් පුහුණු මධ්‍යස්ථානය.

3. වෛද්‍ය කඳවුරු

දළ විශ්ලේෂණය.

සේවක සේවිකාවන්ගේ දුර්වල සෞඛය තත්වයන් හඳුනාගෙන ඊට පිලියමක් ලෙසින් සෞඛය වැඩමුළු කිහිපයක් පවත්වන ලදී. විශේෂයෙන්ම බෝ නොවන රෝග පිළිබඳ වෛද්‍ය කඳවුරු සංවිධානය කළ අතර, එහිදී හැඟී ගියේ බොහෝ සේවක සේවිකාවන් යම් යම් සෞඛය දුර්වලතාවලින් පෙළෙන බවත් ඒ පිලිබඳ නිසි අවබෝධයක් ඔවුන් තුල නොමැති බවයි. මේ පිලිබඳ සොයා බලා අවශ්‍යතා අනුව ඔවුන් සායන වලට සහභාගී කරවීම, අවශ්‍ය උපදෙස් ලබාදීම සිදුකරන ලදී.

ඊට අමතරව සේවක සේවිකාවන් ඉලක්ක කර ඔවුනගේ ඇස් පරීක්ෂාවක් කර ඔවුන්ට ගැළපෙන ඇස්කණ්ණාඩි ලබා දීම සිදුකළ අතර වෙනත් අකෂි ආබාධ සහිත සේවක සේවිකාවන්ට අවශ්‍ය උපදෙස් ලබා දීම් සිදුකර රෝහල් වෙත යොමු කරන ලදී.

මේ තුළින් බොහෝ සේවක සේවිකාවන්ට තම රාජකාරි කටයුතු පහසුවෙන් කරගෙන යාමට හැකිවිය. මෙම වැඩසටහන් පූර්ව සැලැස්මකට අනුව ලංකාවේ සියලුම පළාත් ආවරණය වන ලෙසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබයි.



(විස්තර සඳහා ඇමුණුම - පිටු අංක 61-62)



අක්ෂි වෛද්‍ය කඳවුර Industrial Park මිරිජ්ජවිල.



අක්ෂි වෛද්‍ය කඳවුර යාපනය.

4. පාසල් උපකරණ බෙදා දීමේ වැඩසටහන

දළ විශ්ලේෂණය.

සේවා නියුක්තිකයින්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් වෙත අධ්‍යාපන ආධාර ලබා දීම මෙහිදී සිදු කරයි. මෙම වැඩසටහන් අංශ 02ක් යටතේ ක්‍රියාත්මක කරනු ලබයි.

අඩු ආදායම්ලාභී කම්කරු පවුල් වල ශිෂ්‍යත්ව විභාගය සමත් වන දරුවන් වෙනුවෙන් පාසල් පොත් පත් ලබා දීම හා පොදුවේ අඩු ආදායම් ලාභී කම්කරු පවුල් නියෝජනය කරන දරුවන් වෙනුවෙන් පාසල් පොත් පත් ලබා දීම මේ යටතේ සිදු කරනු ලබයි.

ලංකාවේ දුෂ්කර ප්‍රදේශ වල අඩු ආදායම් ලබන කම්කරු පවුල් මේ සඳහා තෝරා ගනු ලබයි. ප්‍රදේශයේ කම්කරු කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, කලාප, අධ්‍යාපන කාර්යාල මාර්ගයෙන් තොරතුරු ලබා ගන්නා අතර තෝරා ගනු ලබන දරුවන් වෙත පාසල් බෑග්,පොත්පත් හා උපකරණ ලබා දීම සිදු කරයි.

මෙම වැඩසටහන වසරින් වසර ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සිදු කරන වැඩසටහනකි.



(විස්තර සඳහා ඇමුණුම - පිටු අංක 61-62)



පාසල් උපකරණ බෙදා දීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර.



පාසල් උපකරණ බෙදා දීම ලුණුගම්වෙහෙර.

5. මරණීය අනතුරු ශිෂ්‍යත්ව වැඩසටහන

දළ විශ්ලේෂණය.

ශ්‍රී ලංකාව තුළ කර්මාන්තශාලා වල සිදුවන අනතුරු වලින් මියගිය හෝ පූර්ණ ඛෙලහීන තත්වයට පත් කම්කරු ජනතාවගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් වෙනුවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

යම් කර්මාන්තශාලාවක, වැඩබිමක හෝ සේවා ස්ථානයක සිදු වන කාර්මික අනතුරු පිළිබඳ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන් මාර්ගයෙන් ලබාගන්නා තොරතුරු හා කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය හරහා ලබා ගන්නා තොරතුරු පදනම් කර ගෙන ප්‍රතිලාභීන් හඳුනා ගන්නා අතර මියගිය හෝ පූර්ණ ඛෙලහීන තත්ත්වයට පත් වන සේවක සේවිකාවන්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් (පෙර පාසල් අධ්‍යාපනයේ සිට විශ්ව විද්‍යාල හෝ උසස් අධ්‍යාපනය දක්වා එනම්, වයස 3-25) දරුවන් මේ සඳහා සුදුසුකම් ලබන අතර, එවැනි දරුවන් වෙනුවෙන් රු.50,000/= ස්ථාවර තැන්පතුවක් හා අධ්‍යාපන උපකරණ ලබා දීම කරනු ලබයි.



මරණීය අනතුරු ශිෂ්‍යත්ව වැඩසටහන





මරණීය අනතුරු ශිෂ්‍යත්ව වැඩසටහන හා දානමය පිංකම

6. සේවක සුභසාධන වැඩසටහන
දළ විශ්ලේෂණය.

ඵලදායී හා තෘප්තිමත් සේවක පිරිසක් බිහි කිරීමේ අරමුණු ඇතිව සේවක සේවිකාවන්ට අවශ්‍ය උපකාරක සේවා ලබාදීම මෙහිදී සිදු කරයි. සේවක පිරිස් බහුල හෝ නේවාසිකව සේවය කරන අපනයන සැකසුම් කලාප හෝ ආයෝජන ප්‍රවර්ධන කලාපයන් ඉලක්ක කර සේවක සේවිකාවන්ගේ අවශ්‍යතා වෙනුවෙන් ක්‍රීඩාපිටි නවීකරණය කිරීම, සෞඛ්‍ය පහසුකම් නංවාලීම, වෙනත් උපකාරක පහසුකම් සැපයීමට කටයුතු කිරීම, කම්කරු දෙපාර්තමේන්තුව හා එක්ව සමාජ කතිකා හා වැඩපොළ සහයෝගීතා තරඟ සංවිධානය කිරීම ආදී සේවක අභිප්‍රේරණ වැඩසටහන් මෙහිදී සිදු කරනු ලබයි.





වොලිබෝල් ක්‍රීඩා පිටිය විවෘත කිරීම - 2019 පෙබරවාරි මස 22 පල්ලෙකැලේ අපනයන සැකසුම් කලාපය.

අරමුදලේ ප්‍රතිලාභීන් සංයුතිය ස්ත්‍රී පුරුෂ භාවය අනුව



	2017	2018	2019
පුරුෂ	1220	1886	2651
ස්ත්‍රී.	974	1036	1576



	2017	2018	2019
පුරුෂ	10	17	17
ස්ත්‍රී	2	3	8



	2017	2018	2019
පුරුෂ.	23	235	250
ස්ත්‍රී.	740	261	829

මූල්‍ය කොරතුරු

ශ්‍රම වාසනා අරමුදල,
2019.12.31 දිනට,
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.

		(රුපියල්.) 2019	(රුපියල්.) 2018
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් හා සමාන අයිතම		3,802,821.01	1,731,446.25
තොගය	සටහන 04	858,552.69	2,439,264.83
මුද්දර යන්ත්‍රය සඳහා තැන්පතුව			13,535.00
ස්ථාවර තැන්පතුවල ආයෝජනය		95,000,000.00	107,000,000.00
ලැබිය යුතු අයිතම	සටහන 03	339,478,950.32	306,420,669.22
		439,140,324.02	417,604,915.30
ජංගම නොවන වත්කම්			
ISO තත්ත්ව සහතිකය , වෙබ් අඩවිය			
සහ වෙබ් පද්ධතියේ ආයෝජනය		2,774,958.00	2,745,258.00
අස්පෘශ්‍යය වත්කම්	සටහන 02	28,850.23	23,269.18
දේපල පිරියත හා උපකරණ	සටහන 01	13,133,340.24	11,068,431.62
		15,937,148.47	13,836,958.80
මුළු වත්කම්		**455,077,472.49**	**431,441,874.10**
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු දෑ	සටහන 06	132,044.57	1,190,742.38
වෙන් කිරීම්	සටහන 07	1,949,104.00	1,720,160.00
මුළු වගකීම්		2,081,148.57	2,910,902.38
ශුද්ධ වගකීම්		**452,996,323.92**	**28,530,971.72**
සමුච්චිත අතිරික්තය	සටහන 05	452,996,323.92	428,530,971.72
මුළු ශුද්ධ වත්කම්		**452,996,323.92**	**428,530,971.72**

පිටු අංක 43 සිට 48 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම්කරණ සටහන් හා මෙම මූල්‍ය ප්‍රකාශන වල අනිවාර්ය කොටස් වේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAs) අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම
හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශ අත්සන් කර ඉදිරිපත් කරන ලදී.

Chairman	Director	General Manager	Accountant
D.M.S. Abayagunawardena	A.Wimalaweera	D.R.Jayalath	M.L.Jayamali
ShramaVasana Fund	ShramaVasana Fund	ShramaVasana Fund	ShramaVasana Fund

D. M. Sarath Abayagunawa... Secretary ...ry of Skills Develop...

A. WIMALAWEERA Commissioner General of Labour Department of Labour

D. R. Jayalath General Manager Shrama Vasana Fund Ministry of Labour & Labour Relations

M. LAKMINI JAYAMALI Accountant Shrama Vasana Fund Ministry of Labour & Labour Relat...

Final Accounts 2019

"Shrama Vasana Fund" No 97, Jawaththa Road, Colombo 05

ශ්‍රම වාසනා අරමුදල,
2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය.

		(රු.)	(රු.)
		2019	2018
ආදායම	සටහන 09	73,246,457.89	63,241,723.15
මුළු ආදායම		73,246,457.89	63,241,723.15
වියදම			
පරිපාලන වියදම්	සටහන 10	15,849,845.47	13,931,486.84
ක්ෂය වීම්	සටහන 11	1,983,224.05	2,000,515.06
අරමුණු සඳහා දරණ ලද වියදම	සටහන 12	32,556,007.49	28,071,637.74
වෙනත් වියදම්	සටහන 13	1,024,642.02	---- .
		51,413,719.03	44,003,639.64
වර්ෂයේ අතිරික්තය		21,832,738.86	19,238,083.51

ශ්‍රම වාසනා අරමුදල.
2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා,
ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය.

		(රුපියල්)	(රුපියල්)
		සමුච්චිත අරමුදල	එකතුව
2017.12.31 දිනට ශේෂය		411,359,622.84	411,359,622.84
පෙර වර්ෂයේ ගැලපීම්		(1,661,340.43)	(1,661,340.43)
පාරිතෝෂික සඳහා වෙන් කිරීම	සටහන 14.4	(387,044.00)	(387,044.00)
වැටුප් සහ උත්සව අත්තිකාරම් - විනය පරීක්ෂණ	සටහන 14.5	(18,350.20)	(18,350.20)
වර්ෂයේ අතිරික්තය		**19,238,083.51**	**19,238,083.51**
2018.12.31 දිනට ශේෂය		428,530,971.72	428,530,971.72
පෙර වර්ෂයේ ගැලපීම්	සටහන 14	2,632,613.34	2,632,613.34
වර්ෂයේ අතිරික්තය		21,832,738.86	21,832,738.86
2019.12.31 දිනට ශේෂය		**452,996,323.92**	**452,996,323.92**

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.

මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය	(රුපියල්.) 2019	(රුපියල්.) 2018
වර්ෂයේ අතිරික්තය	21,832,738.86	17,576,743.08
ගැලපීම්		
කාරක ප්‍රාග්ධන ගැලපීම්-ස්ථාවර තැන්පතු	2,692,741.10	
සේ.අ.අ /සේ.හා.අ හිඟ	(585,673.10)	
සේ.අ.අ අධිභාරය	(95,489.28)	
	23,844,317.58	
මුදල් නොවන වලනයන්		
ක්ෂය	1,973,103.05	2,000,515.06
ක්‍රමක්ෂය	10,121.00	
ප්‍රත්‍යාගණන අලාභ සහ ලාභ		(157,154.23)
ආයෝජන පොළී	(12,889,709.06)	(11,104,892.32)
ආපදා ණය පොළී	(51,460.44)	(34,996.90)
Repo ආයෝජන පොළී	(70,178.39)	(110,766.23)
වෙනත් ආදායම්	(13,770.00)	(224,347.70)
කාරක ප්‍රාග්ධනයේ වැඩි වීම /අඩු වීම		
වෙනත් ගෙවිය යුතු දෑ වල වැඩි වීම /අඩු වීම	(1,058,697.81)	(1,591,621.07)
වෙන් කිරීම් වල වැඩි වීම /අඩු වීම	228,944.00	(4,591,408.38)
වෙනත් ලැබිය යුතු දෑ වල වැඩි වීම /අඩු වීම	(33,058,281.10)	(8,412,871.53)
තොගයේ වැඩි වීම /අඩු වීම	1,580,712.14	981,112.10
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	(19,504,899.03)	(5,669,688.12)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම්	(739,938.00)	(1,323,300.00)
ආයෝජන පොළී	51,460.44	34,996.90
Repo ආයෝජන පොළී	70,178.39	110,766.23
වෙනත් ආදායම්	13,770.00	224,347.70
මුද්දර යන්ත්‍රය සහ රක්ෂණය තැන්පතුව	13,535.00	307,203.94
ISO තත්ත්ව සහතිකය ,වෙබ් පද්ධතියේ ආයෝජනය	(29,700.00)	(685,000.00)
පර්යේක්ෂණ හා සංවර්ධන	---	295,175.00
මෘදු කාංග සංවර්ධන	---	549,000.00
සේවක පුහුණු වීම්	---	225,490.00
ස්ථාවර තැන්පතුවල ආයෝජනය	12,000,000.00	(4,000,000.00)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	21,576,273.79	6,843,572.09
මුදල් හා මුදල් හා සමාන දෑ වල ශුද්ධ අඩු වැඩි වීම්	2,071,374.76	1,173,883.97
කාලපරිච්ඡේදය ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන දෑ	1,731,446.25	557,562.28
කාලපරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් හා සමාන දෑ	**3,802,821.01**	**1,731,446.25**

ශ්‍රම වාසනා අරමුදල
ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ සටහන්
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්-2019

01.පොදු තොරතුරු

ශ්‍රම වාසනා අරමුදල 1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනත හා 2019 අංක 15 දරණ ශ්‍රම වාසනා අරමුදල් (සංශෝධන) පනත මගින් සංස්ථාගත කර ඇත.

ශ්‍රම වාසනා අරමුදල නො.97,ඡාවත්ත පාර,කොළඹ 05 යන ස්ථානයේ පිහිටා තිබේ.

ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් වල ස්වභාවය

පනතේ සඳහන් පරිදි ශ්‍රම වාසනා අරමුදලේ ප්‍රධාන කාර්යයන් පහත සඳහන් වේ.

1. සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම යටතේ කම්කරු සුබසාධනය ප්‍රවර්ධනය කිරීම ප්‍රමුඛ වේ. තෘප්තිමත් හා ඵලදායී ශ්‍රම බලකායක් ඇති කිරීමේ අරමුණින් කම්කරු ප්‍රජාව වෙත අවශ්‍ය මූල්‍යමය හා ද්‍රව්‍යමය සහන ලබාදීම සිදුකරයි.

   •. කම්කරු ප්‍රජාව දැනුවත් කිරීම, ඔවුන් හා ඔවුන්ගේ පවුල් වල සාමාජික/සාමාජිකාවන් සවිබල ගැන්වීම, කම්කරු පවුල් වල සුබසාධන කටයුතු හා ඔවුන්ට අවශ්‍ය වෛද්‍ය පහසුකම් ලබා දීම.

2. සේවා නියුක්තිකයන් සේවයෙහි යෙදී සිටි ආයතන පුර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ අවස්ථාවක ඒ සේවා නියුක්තිකයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම.

   මේ යටතේ රැකියා අහිමි වන අයට තාක්ෂණික අධ්‍යාපනය ලබා දීම සිදු කෙරේ.

3. හදිසි අවස්ථා වලදී සේවා නියුක්තයන්ට හා ඔවුන්ගේ යැපෙන්නන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම.

   •. වෛද්‍ය සායන වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීම, කෘතීම අත්පා ලබා දීම.

4. සේවා නියුක්තයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටකදී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම.

   •. මේ යටතේ නීති ආධාර ක්‍රමයක් ක්‍රියාත්මක වන අතර, ඒ තුළින් අදියර 3ක් යටතේ නීති ආධාර ලබා දේ.

5. ව්‍යවසන අවස්ථා වලදී සේවා නියුක්තයන්ට හෝ ඔවුන්ගේ යැපෙන්නන්ට මූල්‍යමය හා වෙනත් පහසුකම් සැපයීම.

   •. මරණීය අනතුරු ශිෂ්‍යත්ව ලබා දීම.

6. සේවා නියුක්තිකයන්ගේ සුභ සාධනය සඳහා විශිෂ්ඨ සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

1.පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති.

1.1 වාර්තා කරණ ඒකකය.

ශ්‍රම වාසනා අරමුදල 1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනත හා 2019 අංක 15 දරණ ශ්‍රම වාසනා අරමුදල් (සංශෝධන) පනත මගින් සංස්ථාගත කර ඇත.

1.2 නිකුත් කිරීම සඳහා බලය පවරන දිනය.

2020 පෙබරවාරි 21 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අවසර ලබා දෙන ලදී.

1.3 වාර්තාකරණ කාලපරිච්ඡේදය.

ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය කාලපරිච්ඡේදය 2019 ජනවාරි 01 දින සිට 2019 දෙසැම්බර් මස 31 වන දින දක්වා මාස 12 ක කාලපරිච්ඡේදය නියෝජනය කරයි.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

1.4.1 අනුකූලතා ප්‍රකාශය

මෙම මූල්‍ය ප්‍රකාශන වලට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය,මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය,හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය,මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා මූල්‍ය ප්‍රකාශ වලට සටහන් ඇතුලත් වේ. මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණයේ උපචිත පදනම මත ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS'S) අනුකූල ව පිළියෙල කොට ඉදිරිපත් කර ඇත.

1.4.2 මිනුම් කිරීමේ පදනම

වත්කම් නැවත ඇගයීම සඳහා ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. මෙම ගිණුම් වලට බලපාන උද්ධමනකාරී සාධකයන් ගණනය කොට නැත.

1.4.3 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුකූලතාවය දැක්වීම සඳහා ප්‍රමාණාත්මක ,විස්තරාත්මක තොරතුරු ඇතුළු සංසන්දනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හා සැසඳිය හැකි වන පරිදි මූල්‍ය ප්‍රකාශ තුලින් වාර්තා කර ඇති සියලුම වටිනාකම් පෙර වර්ෂ වලට අනුව හෙලිදරව් කිරීම් කර ඇත.

අවශ්‍ය අවස්ථාවලදී වත්මන් වර්ෂයේ ඉදිරිපත් කිරීම් තහවුරු කිරීමට සංසන්දනාත්මක සංඛ්‍යා සංශෝධනය කර ඇත.

1.4.4 ව්‍යවහාරික හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

ශ්‍රම වාසනා අරමුදලේ ව්‍යවහාරික හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වටිනාකමෙන් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

1.4.5 ගිණුම්කරණ ඇස්තමේන්තු හා විනිශ්චයන් භාවිතය

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී සහ ඇතැම් ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේදී විනිශ්චයන් ,තීන්දු තීරණ හා උපකල්පන භාවිතයට ගැනීම අවශ්‍යය වන අතර ඒවායේ ඇති අවිනිශ්චිත භාවය නිසා අනාගත කාලසීමා සඳහා ඉදිරියට ගෙනයනු ලබන ශේෂයන්ගේ සුවිශේෂී ගැලපුම් සිදු කිරීමේ අවශ්‍යතාවය පැන නැගීමට ඉඩ ඇත.

ශ්‍රම වාසනා අරමුදලේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියා වලියේ දී මූල්‍ය ප්‍රකාශන වල සුවිශේෂී බලපෑමක් කරනු සමත් පහත දැක්වෙන තීරණ නිශ්චය කිරීම් සහ උපකල්පන කළමණාකාරීත්වය විසින් සිදු කර ඇත.

අ) දේපල පිරියත හා උපකරණ වල ඵලදායී ජීව කාලය

වත්කමේ ඵලදායී ජීව කාලය , ක්ෂය කිරීමේ ක්‍රම වේදය හොඳම ඇස්තමේන්තුව මත පදනම්ව කළමණාකරණය විසින් තීරණය කරනු ලබන අතර එම නිසාම ඒවා අවිනිශ්චිත තාවයෙන් යුක්ත වේ.

ගිණුම්කරණ ඇස්තමේන්තු සහ තීරණාත්මක විනිශ්චයන්වල යම් වෙනස්කම් මූල්‍ය වාර්තා වලට අදාල සටහන් තුල හෙලිදරව් කර ඇත.

ආ)අඛණ්ඩ පැවැත්ම

ශ්‍රම වාසනා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අවිනිශ්චිතතාවයක් ඇති වන සැලකිය යුතු කිසිවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනා ගෙන නොමැති නිසා අරමුදලේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ අඛණ්ඩ පැවැත්ම පදනමක් මත වන අතර ගිණුම්කරණ ප්‍රතිපත්ති එම කාලය පුරාම ක්‍රියාත්මක වේ.

1.5 වත්කම් හා වත්කම් තක්සේරු කිරීමේ පදනම

1.5.1දේපල පිරියත හා උපකරණ (PPE)

අ) හඳුනාගැනීම හා මිනුම්ගත කිරීම

දේපල පිරියත හා උපකරණ ඒවායේ අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය සතු වන්නේ දැයි හෝ එහි පිරිවැය දේපල පිරියත හා උපකරණ පිළිබඳ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුකූලව විශ්වාසදායී ලෙස මැනිය හැකි දැයි යන්න මත ඒවායේ ධාරණ අගය විනිශ්චය කිරීම හා ක්ෂය කිරීම හා ඒවාට අදාල හානිකරණ අලාභ හඳුනා ගනු ලැබේ.

මුලික අදියරේ දී දේපල පිරියත හා උපකරණ එහි පිරිවැයට තක්සේරු කරනු ලබයි.

ආ)පිරිවැය

දේපල පිරියත හා උපකරණ වල පිරිවැය එහි මිලදී ගැණුම් පිරිවැය සහ එහි අදහස් කරන භාවිතය සහ කාර්යය මට්ටමට සෘජුවම දායක විය හැකි යම් පිරිවැය ඇතුලත් වේ.

දේපල පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කල පසු ලැබෙන පිරිවැයට දක්වනු ලැබේ.

ත්‍යාග වශයෙන් අරමුදලට ලද වත්කම් සමුච්චිත අරමුදලට බැර කර දේපල පිරියත හා උපකරණ ගිණුමට හර කර ඇත.

ඇ). පසුකාලීන වියදම්

වත්කම් වල ඉපැයීමේ ධාරිතාව පවත්වා ගෙන යාම හෝ වැඩි කිරීම සඳහා ස්ථීර ස්වභාවයේ වත්කම් අත්පත් කරගැනීම,ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීමේ අරමුණ සඳහා දැරූ පසුකාලීන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සැලකේ.

ඇ). ක්ෂය වීම්

ඉඩම් හැර සෙසු වත්කම් ක්ෂය කිරීමේදී දේපල පිරියත හා උපකරණ අයිතම වල එක් එක් කොටස්වල ජීවිත කාලය පුරා සරල රේඛීය ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.වත්කම් භාවිතයට ගන්නා අවස්ථාවේ සිට එය ඉවත් කරන දිනය දක්වාම ක්ෂය කිරීම සිදු කරනු ලැබේ.

පහත ක්ෂය අනුපාත යටතේ ක්ෂය කරනු ලැබේ.

වාහන	10%
යන්ත්‍රෝපකරණ	20%
වායුසමීකරණ	20%
ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ	25%
පරිඝණක	25%
ලී බඩු සහ සවිකිරීම්	10%
කාර්යාල උපකරණ	7.5%
මෘදු කාංග	20%

ඉ). අස්පෘශ්‍ය වත්කම්

අස්පෘශ්‍ය වත්කම් යනු මූල්‍ය වටිනාකමක් සහිත භෞතික නොවන වත්කම් වේ.

ඊ). හඳුනාගැනීමේ පදනම

වත්කමක පිරිවැයට වඩා විශ්වාසවන්තව මැනිය හැකි මෙන්ම එම වත්කම අනාගත අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරය තුලට ගලා එන්නා වූ භෞතික පැවැත්මක් නොමැති වත්කම් මේ යටතේ හඳුනා ගැනේ.

•. ගිණුම්කරණ මෘදුකාංග

ආයතනය විසින් මිලදී ගන්නා ලද ගිණුම්කරණ මෘදුකාංග අත්පත් කර ගැනීමේ පිරිවැය මත මිනුම් කිරීම සිදු කරන අතර,පිරිවැයෙන් සමුච්චිත ක්‍රම ක්ෂය කපා හැරීම සිදු කරයි.

උ)අස්පෘශ්‍ය වත්කම් ක්ෂය

වත්කම භාවිතයට ගත් දිනයේ සිට වත්කම් ඵලදායී ජීවිත කාලය පුරා සරල මාර්ග ක්‍රමයට ක්‍රම ක්ෂය කිරීමෙන් ආදායම් ප්‍රකාශනයට ගැලපීම සිදු කරයි.

ඌ). වත්කම් ප්‍රත්‍යාගණනය.

ප්‍රත්‍යාගණනය රජයේ පිළිගත් ඒ පිළිබඳ වෘත්තීය සුදුසුකම් ලත් පුද්ගලයෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් වාහන හැර අනෙකුත් සියලුම දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය (SLAPS 07) සිදු කර ඇත.

අරමුදලට පවරා දුන් KO 7519 කාර් රථය රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් අගය කර ඇත. සියලු නව ප්‍රත්‍යාගණන වටිනාකම් ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයේ ඉදිරිපත් කර ඇත.

එ). ඉවත් කිරීම

දේපල පිරියත හා උපකරණ පවත්නා වටිනාකම ඒවා විකිණීමේදී හෝ එමගින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ නොලැබෙන අවස්ථා වලදී ඉවත් කිරීම සඳහා හඳුනා ගැනේ. ප්‍රාග්ධන අයිතම බැහැර කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLAPS 07)අනුකූලව ගිණුම් ගත කර ඇත.

1.5.2 තොගය

තොගය පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ප්‍රකාශ කෙරේ. තොගය බර තැබූ සාමාන්‍ය පිරිවැය මත නිකුත් කිරීම සිදු කර ඇත.

1.5.3 ලැබිය යුතු ගිණුම්

ලැබිය යුතු ගිණුම් එක්රැස් කරගත නොහැකි සියලුම වටිනාකම් සඳහා වන සියලුම බිල්පත් වල වටිනාකම වේ. ලැබිය යුතුගිණුම් ප්‍රධාන වශයෙන් සමන්විත වන්නේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් සහ ස්ථාවර තැන්පතු වලින් ලැබිය යුතු පොළිය වේ.

අ) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු මුදල්

ශ්‍රම වාසනා අරමුදලට ලැබිය යුතු ප්‍රධාන ආදායම් ප්‍රභවය ජාතික සම්පත ලොතරැයි අලෙවිය මගින් ලැබෙන අලෙවි ආදායමෙන් 10% දායකත්වය දැක්විය හැක. සෑම මසකම එසේ ලැබෙන ලොතරැයි ආදායම ලොතරැයි මණ්ඩලය මගින් ඒකාබද්ධ අරමුදලට බැර කෙරෙන අතර අරමුදලේ වාර්ෂික අවශ්‍යතාවට අනුව කාර්තු වශයෙන් මුදල් නිකුත් කෙරේ.

ඒකාබද්ධ අරමුදල තුල ශ්‍රම වාසනා අරමුදල නමින් අරමුදලට ලැබිය යුතුව ඇති මුදල මෙමගින් නිරූපනය වේ.

ආ) ස්ථාවර තැන්පතු ලැබිය යුතු මුදල්

ශ්‍රම වාසනා අරමුදල නමින් රාජ්‍ය බැංකු හතරක පවත්වා ගෙන යනු ලබන ස්ථාවර තැන්පතු මගින් වර්ෂයට අදාලව ලැබිය යුතු තිබුව තිබූ නමුත් මෙතෙක් නොලැබූ මුදල් වේ.

15.4 ආයෝජන

ආයෝජන වසරකට වඩා අඩු කාලයක් සඳහා වූ කෙටිකාලීන ආයෝජන සහ වසරකට වඩා වැඩි කාලයක් සඳහා වූ දිගුකාලීන ආයෝජන වලින් යුක්ත වේ. මාස තුන මාස හය සහ අවුරුද්දක කාලයක් සඳහා ස්ථාවර තැන්පතු වල සිදු කරන ලද කෙටිකාලීන ආයෝජනයන්ද
ශ්‍රම වාසනා අරමුදලේ වෙබ් අඩවිය සහ පරිසණක ගත තොරතුරු පද්ධතිය සහ ප්‍රමිත සහතිකය ලබා ගැනීම තෙක් සිදු කරන ලද දිගුකාලීන ආයෝජනයන් ද නිරූපනය වේ.

1.5.5 මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් හා මුදල් හා සමාන අතැති මුදල් සහ බැංකු තැන්පතු වලින් සමන්විත වේ.

1.6 වගකීම් සහ වෙන්කිරීම්

ශේෂ පත්‍ර දිනට පවතින සියලුම ප්‍රමාණාත්මක වගකීම් මූල්‍ය ප්‍රකාශනයේ ඇතුලත් කර ඇති අතර ශේෂ පත්‍ර දිනට පවතින නමුත් වටිනාකම නිවැරදිවම අගය කල නොහැකි වගකීම් සඳහා ප්‍රමාණවත් වෙන් කිරීම් සිදු කොට ඇත.

මූල්‍ය තත්ව ප්‍රකාශයේ සඳහන් දින සිට වසරක් ඇතුලත ඉල්ලුම මත ගෙවිය යුතු බැදීම් මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් වශයෙන් සැලකේ.මූල්‍ය තත්ව ප්‍රකාශයේ දින සිට වසරකට පසු ගෙවිය යුතු වගකීම් මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් වශයෙන් සැලකේ.

1.6.1 විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම් හා ප්‍රතිපාදන

අ) පාරිතෝෂික ප්‍රතිලාභ සැලැස්ම අර්ථ දැක්වීම

1983 අංක 12 හි පාරිතෝෂික පනත ට අනුව ශ්‍රම වාසනා අරමුදල පාරිතෝෂික ගෙවීමට බැඳී සිටී.ඒ සඳහා ගණනය කරන ලද වෙන්කිරීම් මුල්‍ය ප්‍රකාශනය තුල නිරූපනය කෙරේ.

ආ) දායක සැලසුම් අර්ථ දැක්වීම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සහ සේවක භාරකාර අරමුදල් දායකත්වය සඳහා සුදුසුකම් ලබන සියලුම සේවකයින් අදාළ ප්‍රතිපත්ති හා රෙගුලාසි වලට අනුකූලව අදාළ දායක අරමුදල් මගින් ආවරණය කෙරේ.

සේවකයාගේ මුලු වේතනයෙන් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සඳහා 12% ක් සහ සේවක භාරකාර අරමුදල් දායකත්වය සඳහා 3% ක් අරමුදල විසින් දායක කරනු ලැබේ.

ඇ) නීති ආඥාර ලබා දීම් සඳහා වෙන් කිරීම

ශ්‍රම වාසනා අරමුදලේ එක් අරමුණක් වන නීති ආඥාර ලබා දීමේදී නඩුව විභාග වන අතර තුර පළමු නීති ආඥාර වාරික මුදල් ලබා දෙන අතර දෙවන වාරික මුදල් නඩු වේ නියෝගය ලැබුණු පසු ලබා දීම සිදුවේ. වර්ෂය තුලදී අවසන් නියෝගය නොලද නඩු සඳහා මෙම වෙන් කිරීම් සිදු කර ඇත.

1.7 අවිනිශ්ත වියදම් - කම්කරු විනිශ්චය සභාවේ නඩුව

ශ්‍රම වාසනා අරමුදලේ හිටපු සේවකයින් දෙදෙනෙකු කම්කරු විනිශ්චය සභාවේ අංක 02/788 හා 789 හි නඩු පවරා ඇත.

1.8 මුල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

1.8.1 ආදායම/අයභාරය

වාර්තාකරණ කාලපරිච්ඡේදය තුලදී ලැබීම් ස්වභාවයේ හෝ ශුද්ධ වත්කම් / ස්කන්ධයේ වැඩි වීමේ ප්‍රතිඵලයක් සේ ලැබෙන ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවන්හි දළ ගලා යාමකි. ආදායම හා පොළී ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කරන අතර ආදායමෙහි ඖතික සම්පත ලොතරැයි ආදායම,ස්ථාවර තැන්පතු පොළී ආදායම ප්‍රධාන වේ.

1.8.2 වියදම

වාර්තාකරණ කාලපරිච්ඡේදය තුලදී ගලායෑම් ස්වාභාවයෙන් හෝ වත්කම් පරිභෝජන ස්වාභාවයෙන් හෝ බැරකම් ඇතිවීමේ ස්වාභාවයෙන් සිදුවන ආර්ථික ප්‍රතිලාභයන්ගේ හෝ සේවා ශක්‍යතාවයන්ගේ අඩු වීමකි.

ශ්‍රම වාසනා අරමුදලේ කටයුතු පවත්වා ගෙන යාම ,අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සහ ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමෙහිලා සිදු කරන ප්‍රාග්ධන සහ අයභාර ස්වභාවයේ සියලුම දෑ වේ.

1.9 ශේෂ පත්‍ර දිනට පසු සිදු වීම්

ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන වැදගත් ප්‍රමාණාත්මක සිද්ධීන් සැලකිල්ලට ගෙන මුල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය ගැලපීම් සහ අනාවරණයන් සිදු කිරීමට කටයුතු කර ඇත.

1.10 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS 2)අනුකූලව “වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහය සකස් කර ඇත.

ගිණුම් වලට අදාල සටහන්.
(මෙහි සියලුම අගයන් රුපියල් වලින් දක්වා ඇත)

සටහන 01
දේපල පිරියත හා උපකරණ
01-1

පිරිවැය	ආරම්භක ශේෂය	එකතුවීම්	මාරුකිරීම්/ අත්පත් කිරීම්	අපහරණ/ ලියාහැරීම්	2019/12/31 ශේෂය
වාහන	9,382,500.00	-----	3,500,000.00	-----	12,882,500.00
යන්ත්‍රෝපකරණ	512,380.00	-----	-----	411,330.00	101,050.00
ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ	694,384.00	-----	-----	479,584.00	214,800.00
වායුසමීකරණ	1,279,824.99	-----	-----	1,099,824.99	180,000.00
පරිඝණක	2,655,797.50	721,825.50	-----	1,429,097.50	1,948,525.50
ලී බඩු සහ සවිකිරීම්	1,527,445.87	----	125,500.00	1,023,445.87	629,500.00
කාර්යාල උපකරණ	337,225.57	18,112.50	-----	208,225.57	147,112.50
	16,389,557.93	739,938.00	3,625,500.00	4,651,507.93	16,103,488.00

01-02

ක්ෂය වීම්	ආරම්භක ශේෂය, වර්ෂයේ වෙන් කිරීම්	අපහරණ/ලියා හැරීම්, නිවැරදි කිරීම්	2019/12/31 ශේෂය
වාහන	1,831,160.00	1,016,880.14	----	2,848,040.14
යන්ත්‍රෝපකරණ	309,490.65	63,121.78	368,736.53	3,875.90
ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ	209,470.25	140,065.23	339,236.85	10,298.63
වායුසමීකරණ	1,255,925.19	31,326.32	1,280,347.40	6,904.11
පරිඝණක	966,387.32	565,574.42	1,445,181.77	86,779.97
ලී බඩු සහ සවිකිරීම්	589,122.00	133,772.49	710,821.89	12,072.60
කාර්යාල උපකරණ	159,570.90	22,362.67	179,757.16	2,176.41
	5,321,126.31	1,973,103.05	4,324,081.60	2,970,147.76

සටහන 02

අස්පෘශ්‍ය වත්කම්	ආරම්භක පිරිවැය	එකතුවීම්	අපහරණ/ලියා හැරීම නිවරදිකිරීම්.	2019/12/31 ශේෂය.
මෘදු කාංග	55,500.00	----	25,500.00	30,000.00

ක්‍රම ක්ෂය	ආරම්භක ශේෂය	වර්ෂයේ වෙන් කිරීම්	අපහරණ/ලියාහැරීම් / නිවැරදි කිරීම්	2020/12/31 ශේෂය.
මෘදු කාංග	32,230.82	10,121.00	41,202.05	1,149.77

සටහන 03

වෙනත් ලැබිය යුතු දෑ		
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	332,106,120.18	301,884,780.18
උත්සව අත්තිකාරම්	8,750.00	11,750.00
ආපදා ණය	1,169,250.00	1,022,050.00
ස්ථාවර තැන්පතු ආයෝජන පොළී	6,191,830.14	3,499,089.04
ආපසු ගෙවිය යුතු තැන්පතු	3,000.00	3,000.00
	339,478,950.32	306,420,669.22

සටහන 04

තොගය		
(බර තැබූ සාමාන්‍ය පිරිවැය මත ගණනය කොට ඇත)	**2019**	**2018**
ලිපිද්‍රව්‍ය	435,343.01	560,090.67
වැඩසටහන් තොග	423,209.68	1,879,174.16
	858,552.69	2,439,264.83

සටහන 05

	2019	**2018**
2019.01.01 දිනට සමුච්චිත අරමුදල	431,163,585.06	409,698,282.41
2019 වර්ෂය සඳහා අතිරික්තය	21,832,738.86	19,238,083.51
2019.01.31 දිනට සමුච්චිත අරමුදල	452,996,323.92	428,936,365.92

සටහන 06

වෙනත් ගෙවිය යුතු දෑ	**2019**	**2018**
සුබසාධන වැඩසටහන් ගෙවීම්	31,700.00	801,627.21
දුරකථන ගෙවීම්	26,271.17	26,345.30
වෙනත් ගෙවීම්	18,470.00	126,790.42
විගණන ගාස්තු	--	186,300.00
ජලය සහ විදුලිය	2,840.04	15,053.45
අතිකාල ගෙවීම්	52,763.36	16,275.80
	132,044.57	1,172,392.18

සටහන 07

වෙන්කිරීම්	**2019**	**2018**
නීති ආධාර සඳහා වෙන් කිරීම්	455,000.00	335,000.00
බෙරුම්කරණය මුල්‍ය සහය සඳහා වෙන් කිරීම්	10,000.00	---
නීති ආධාර අභියාවනා සඳහා වෙන් කිරීම්	100,000.00	---
සේවක පාරිතෝෂික සඳහා වෙන් කිරීම්	1,151,604.00	608,116.00
වෙබ් අඩවිය සඳහා වෙන් කිරීම	32,500.00	390,000.00
විගණන ගාස්තු සඳහා වෙන් කිරීම්	200,000.00	- --
	1,949,104.00	1,333,116.00

සටහන 08

ස්ථාවර වත්කම් සරල මාර්ග ක්‍රමයට පහත ක්ෂය අනුපාත යටතේ ක්ෂය කරනු ලැබේ.

වාහන	10%
යන්ත්‍රෝපකරණ	20%
වායුසමීකරණ	20%
ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ	25%
පරිඝණක	25%
ලී බඩු සහ සවිකිරීම්	10%
කාර්යාල උපකරණ	07.5%
මෘදු කාංග	20%

වත්කම් වල අවසාන ක්ෂය කලහැකි වටිනාකම රු.1 ක් ලෙස ක්ෂය දක්වා ඇත.

සටහන 09

ආදායම	**2019**	**2018**
ශ්‍රම වාසනා ලොතරැයි ආදායම	60,221,340.00	51,766,720.00
ස්ථාවර තැන්පතු පොළී ආදායම	12,889,709.06	11,104,892.32
ආපදා ණය පොළී ආදායම	51,460.44	34,996.90
Repo පොළී ආදායම	70,178.39	110,766.23
වෙනත් ආදායම්	13,770.00	224,347.70
	73,246,457.89	63,241,723.15

සටහන 10

පරිපාලන වියදම්	**2019**	**2018**
වැටුප් හා වේතන	5,590,332.81	5,201,661.76
සේවක අර්ථසාධක අරමුදල	1,544,266.80	1,431,472.15
සේවක භාරකාර අරමුදල	231,634.02	214,7200.82
ජීවන වියදම් දීමනාව	1,425,765.00	1,394,690.32
වෙනත් දීමනා	224,140.00	222,040.00
සභාපති දීමනා	230,403.21	209,274.00
ප්‍රායෝගික පුහුණු දීමනා	206,000.00	235,000.00
අධ්‍යක්ෂ දීමනා	547,400.00	518,000.00
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් දීමනා	24,000.00	6,000.00
අභ්‍යන්තර විගණන දීමනා	38,806.00	60,000.00
වෘත්තීය දීමනා	132,000.00	132,000.00
දිරි දීමනා	412,369.00	---
සේවක පාරිතෝෂික	156,444.00	608,116.00
අතිකාල සහ නිවාඩු දීමනා	807,221.02	463,726.59
දේශීය ගමන් වියදම් සහ සංයුක්ත දීමනා	139,703.00	143,973.50
ප්‍රවාහන වියදම්	78,124.00	26,425.00
තෙල් වියදම්	40,153.00	67,426.00
ලිපිද්‍රව්‍ය හා වෙනත්	797,498.66	471,405.85
තැපැල් වියදම්	32,810.04	50,974.99
දුරකථන වියදම්	305,014.00	273,991.76
සංග්‍රහ වියදම්	43,949.00	84,975.50
ආහාර පාන සහ වෙනත් වියදම්	199,521.78	192,933.00
විවිධ වියදම්	7,744.32	25,354.00
වෙනත් වියදම්	156,421.65	46,392.19
විගණන වියදම්	200,000.00	245,000.00
ජලය සහ විදුලි වියදම්	70,793.96	102,467.16
වෙනත් සේවා වියදම්	492,276.74	432,658.89
නඩත්තු සහ අළුත් වැඩියා වියදම්	760,335.73	477,463.00
සේවක සුබසාධන වියදම්	175,000.00	295,594.36
සේවක පුහුණු වීම් සඳහා ගෙවීම්	779,717.73	297,750.00
	15,849,845.47	13,931,486.84

සටහන 11

ක්ෂය	**2019**	**2018**
වාහන ක්ෂය	1,016,880.14	923,900.00
පරිසනක ක්ෂය	565,574.42	403,440.23
වායු සමීකරණ ක්ෂය	31,326.32	255,965.00
ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ ක්ෂය	140,065.23	145,121.34
ලී බඩු සහ සවිකිරීම් ක්ෂය	133,772.49	152,444.59
කාර්යාල උපකරණ ක්ෂය	22,362.67	26,101.54
යන්ත්‍රෝපකරණ ක්ෂය	63,121.78	84,304.00
මෘදු කාංග ක්‍රම ක්ෂය	10,121.00	9,238.36
	1,983,224.05	2,000,515.06

සටහන 12

අරමුණු ලඟා කරගැනීම සඳහා දරනු ලබන වියදම්	**2019**	**2018**
සෞඛ්‍ය කදවුරු වැඩසටහන්	9,433,841.18	4,965,408.89
සවිබල ගැන්වීමේ වැඩසටහන්	4,751,765.35	2,284,659.66
දැනුවත් කිරීමේ වැඩසටහන්	1,113,159.00	1,168,907.00
සුබසාධන වැඩසටහන්	9,234,460.45	7,874,648.37
කෘතීම අත්පා ලබා දීමේ වැඩසටහන්	46,500.00	2,479,803.00
තාක්ෂණික අධ්‍යාපනික වැඩසටහන්	11,600.00	10,000.00
වෛද්‍ය සහන වැඩසටහන්	550,000.00	212,147.50
නීති ආධාර වැඩසටහන්	580,000.00	11,923.52
නීති සහන -අභියාචනා	320,000.00	90,000.00
නීති සහන -බේරුම්කරණය	30,000.00	---
නීති ආධාර-ශිෂ්‍යත්ව ලබා දීම	45,189.20	---
ශිෂ්‍යත්ව වැඩසටහන්	6,439,492.31	3,891,722.49
සම්මාන උළෙල	---	1,696,079.71
ලොතරැයි අලෙවිය මහජන දැනුවත් කිරීම්	---	2,723,050.20
ඵලදායීතා ප්‍රවර්ධනය	---	363,287.40
	32,556,007.49	28,071,637.74

සටහන 13

වෙනත් වියදම්		
ලොතරැයි අලෙවිය මහජන දැනුවත් කිරීම්	954,642.02	----
ISO තත්ව පරීක්ෂණ වියදම්	70,000.00	----
	1,024,642.02	-----

සටහන 14

පෙර වර්ෂවල ගැලපීම්	
සේ.අ.අ /සේ.භා.අ හිඟ	(585,673.10)
වත්කම් විකිණීමේ අලාභය	(5,376.00)
වැටුප් සහ උත්සව අත්තිකාරම් -විනය පරීක්ෂණ	(18,350.20)
සේ.අ.අ අධිභාරය	(95,489.28)
KO 7519 වාහනය අත්පත් කර ගැනීම	3,500,000.00
වත්කම් ප්‍රත්‍යාගණන අලාභ	(306,348.28)
ලී බඩු අත්පත් කර ගැනීම්	125,500.00
	2,614,263.14

14.1
සේ.අ.අ /සේ.හා.අ හිග,අධිභාරය
සේවක අර්ධසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල 2005 සිට 2016 දක්වා ගණනය කොට ඇත්තේ ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගෙන මූලික වැටුප මත පදනම්වය, එය නිවැරදි කිරීම.
සේවක අර්ධසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල් හිග සහ අධිභාර මේ වන විට සකස් කර ඇත.

14.2

KO 7519 (TOYOTA YARIS) වාහනය අත්පත් කර ගැනීම:- කම්කරු අමාත්‍යාංශය විසින් KO 7519 යන වාහනය ශ්‍රම වාසනා අරමුදලට පවරා දී ඇත. එම වාහනය රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් අගය කර ඇත.
ගෘහ භාණ්ඩ අත්පත් කර ගැනීම :- කම්කරු අමාත්‍යාංශය මගින් පවරා දී ඇති ගෘහ භාණ්ඩ සාධාරණ වෙළඳපොළ වටිනාකම මත අගය කොට ඇත.
14.3
ස්ථාවර වත්කම් නැවත ඇගයීම :- ස්ථාවර වත්කම් සහ අස්පෘශ්‍ය වත්කම් 2019.10.22 වන දින නැවත ඇගයීම සිදු කර ඇත.
14.4

පාරිතෝෂික සඳහා වෙන් කිරීම :- 2018 වර්ෂය සඳහා වූ පාරිතෝෂිකය ගණනය කර ඇත්තේ ජීවන වියදම් දීමනාව සලකා සැලකිල්ලට නොගෙන මූලික වැටුප මත පදනම්ව වන හෙයින් එය නිවැරදි කිරීම.

14.5

වැටුප් සහ උත්සව අත්තිකාරම් -විනය පරීක්ෂණ
උත්සවය අත්තිකාරම් අඩු කිරීමෙන් පසු සියලු හිඟ මුදල් වෙන් කිරීමට ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.

සටහන 15

කම්කරු විනිශ්චය සභාවේ නඩුව
ශ්‍රම වාසනා අරමුදලේ හිටපු සේවකයින් දෙදෙනෙකු කම්කරු විනිශ්චය සභාවේ අංක 02/788.789/218 හි නඩු පවරා ඇත.

සටහන 16

සංසන්දනාත්මක තොරතුරු
පෙර වර්ෂ වල සංඛ්‍යා දත්ත නිවැරදි කර පවත්නා වර්ෂයේ සංඛ්‍යා දත්ත සනාථ කිරීම සඳහා අවශ්‍ය පරිදි ඉදිරිපත් කොට ඇත.

සටහන 17

කොන්ත්‍රාත්තු සඳහා අධ්‍යක්ෂ වරුන්ගේ සම්බන්ධතාවය
මණ්ඩලයේ කොන්ත්‍රාත්තු පිළිබඳව සෘජු හෝ වක්‍ර උනන්දුවක් කිසිදු අධ්‍යක්ෂකවරයෙකුට නොමැත.

සටහන 18

අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්ඊඩබ /ඒ /එස්වීඑෆ් 2/2019/2

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2020 අගෝස්තු 28 දින

සභාපති,
ශ්‍රම වාසනා අරමුදල.

ශ්‍රම වාසනා අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රම වාසනා අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනතේ 12 (4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණන කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Poldhuwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 53 වන වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් පැනනැඟුනු රු.306,348 ක් වූ ප්‍රත්‍යාගණන අලාභය ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ පෙන්විය යුතු වුවත් එලෙස සිදුනොකර පෙර වර්ෂ ගැලපුම් ලෙස සමුච්චිත අරමුදලෙන් ගලපා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය වී තිබුණු පිටුවැය රු.430,420 ක් වූ ස්ථාවර වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වී තිබුණු ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශ විසින් 2019 වර්ෂය තුලදී අරමුදල වෙත පවරා දී තිබූ රු.3,500,000 ක් වූ මෝටර් රථයක් හා කම්කරු දෙපාර්තමේන්තුව විසින් පවරා දී තිබූ රු.125,500 ක් වූ ලිඛිඩු උපකරණ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස හඳුනානොගෙන, පෙර වර්ෂ ගැලපුම් ලෙස සමුච්චිත ලාභයට ගලපා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ කාරක ප්‍රාග්ධන ගැලපීම් ලෙස ස්ථාවර තැන්පතු රු.2,692,741 ක ශේෂය සම්බන්ධයෙන් විගණනයේදී තහවුරු කිරීමක් ඉදිරිපත් නොවුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටස් තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් නැඹීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ

අවදානම් මහඟරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුෂ්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම්, වෙතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගත්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම්, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ

පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදල පවත්වාගෙන ගොස් ඇති බව,

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගත්තා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදල සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලන මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධාන අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

නීතිරීති විධානයට යොමුව	විස්තරය
(ඇ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය (i) 7.9.9 මාර්ගෝපදේශය	ඩෙස්ක්ටොප් පරිගණක 3 ක් රු.565,405 කට මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුත්තේදී අවම මිල ඉදිරිපත් කල ලංසුකරු ප්‍රතික්ෂේප කිරීම සඳහා අරමුදල විසින් කාක්ෂණික කරුණු සම්බන්ධව එම ලංසුකරුවෙකුගෙන් වාචිකව පැහැදිලි කිරීම් ලබාගෙන තිබුණද මාර්ගෝපදේශයේ දැක්වෙන පරිදි ලිඛිත පැහැදිලි කිරීම් ලබාගෙන නොතිබුණි.
(ii)3.4.3(ඇ) මාර්ගෝපදේශය	ලියාපදිංචි සැපයුම්කරුවන් සිටියදී ඊට පරිභාහිර ආයතනවලින් රු.127,700 ක භාණ්ඩ මිලට ගෙන තිබුණි.

(ආ) 2015.06.17 දිනැති අංක PED 3 / 2015 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛයේ 2.1 ඡේදය	ආයතනයේ සේවයේ නියුතු විධායක අධ්‍යක්ෂවරුන්ට සහ සභාපතිවරයාට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා පැමිණීමේ දීමනා ලබා ගත නොහැකි වුවත් එයට පටහැනිව 2019 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 07 ක් සඳහා සහභාගි වීම වෙනුවෙන් පැමිණීමේ දීමනා ලෙස රු.42,000 ක් සභාපතිවරයා වෙත ගෙවා තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල, කර්තව්‍ය සහ කාර්යන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පහත සඳහන් නිරීක්ෂණ හැර සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුල අදාල නිර්ණායකවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.1 අනෙකුත් විගණන නිරීක්ෂණ

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2019 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අරමුදල විසින් ඉටු කල යුතුව තිබූ කාර්යභාරයන් අතරින් රු.මිලියන 2.41 ක් වෙන් කල කාර්යභාරයන් 7 ක් ඉටුකර නොතිබුණි. ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී ඉහත වැඩසටහන්වල ස්වරූපය (Nature) සහ විෂය පථයේ පැවති දුර්වලතා හේතුවෙන් ක්‍රියාත්මක කල නොහැකිව තිබුණද කළමනාකරණය විසින් ඒ පිළිබඳ සැලකිල්ලට නොගෙන එම කාර්යයන් දිගින් දිගටම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර තිබුණි.

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබූ වෛද්‍ය සහනාධාර යැපයීම, කෘතිම අත්පා බෙදාදීම් හා ලොතරැයි විකුණුම් වැඩිකිරීමේ වැඩසටහන් සංඛ්‍යාව 85 ක් වූ අතර ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල රු.මිලියන 3.3 ක් විය. එසේ වුවද සමාලෝචිත වර්ෂ අවසානයට ඉන් වැඩසටහන් 15 ක් පමණක් පවත්වා තිබූ අතර, රු.මිලියන 1.3 ක් වැයකර තිබුණි. ඒ අනුව භෞතික කාර්යසාධනය සියයට 17 ක් වුවද මූල්‍ය කාර්යසාධනය සියයට 39 ක් බව නිරීක්ෂණය විය.

ඩබලිව්.ඩී.ඩී.වික්‍රමරත්න
විගණකාධිපති

2019 විගණන වාර්තාව සම්බන්ද අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය.

ශ්‍රම වාසනා අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සම්බන්දයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග.

1.මූල්‍ය ප්‍රකාශන.

1.2.(අ) ප්‍රත්‍යාගණන සංචිත ගිණුම හරහා ප්‍රත්‍යාගණන අලාභය කපා හැර ඉතිරිය ප්‍රවර්තන වර්ෂයේ ආදායම් ප්‍රකාශයෙන් අඩු කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ඇත.

(ආ) 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී ප්‍රත්‍යාගණනය කළ යුතු වත්කම් තීරණය කිරීමෙන් පසුව වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කරන ලදී. 2019 වර්ෂය තුලදී සියලුම වත්කම් කාණ්ඩ ප්‍රත්‍යාගණනය කිරීම සිදු කළ නිසා ඉදිරියේදී ක්ෂය වී අවසන් වීමට පෙර අදාළ සියලුම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ කටයුතු සිදු කරනු ඇත.

(ඇ) කම්කරු අමාත්‍යාංශයෙන් 2019 වර්ෂයේදී පවරා දුන් රු.35,000,000/-ක් වූ KO 7519 දරන කාර් රථය සහ කම්කරු දෙපාර්තමේන්තුවෙන් පවරා දුන් රු.125,500/-ක් වටිනා ලී බඩු හා උපකරණ පෙර වර්ෂයේ ගැලපුම් කිරීමේදී ප්‍රාග්ධනයෙන් ඉවත් කර රජයේ පරිත්‍යාග ලෙස වෙනම ගිණුමකට ගළපා වත්කම් වල ක්ෂය වීම් ද එම ගිණුමෙන් ඉවත් කොට වර්ෂය අවසාන ශේෂය සංචිතය ලෙස පවත්වා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත.

(ඈ) ප්‍රවර්තන වර්ෂයට අදාළව පෙර වර්ෂයේදී ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය සහ මෙම වර්ෂයට අදාළව මීළඟ වර්ෂයේදී ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ආදායම යොදා ගනිමින් වර්ෂයට අදාළව අදායම් ප්‍රකාශයට බැර කළ යුතු ස්ථාවර තැන්පතු පොළී ප්‍රමාණය ගණනය කිරීම සඳහා පාලන ගිණුමක් පිළියෙළ කිරීම සිදු කරන ලදී.ඊට පහත කරුණු හේතු වී ඇත.

වර්ෂය තුළදී ඒකාබද්ධ අරමුදලට ලැබිය යුතු ලොතරැයි ආදායම කොටස් වශයෙන් කාර්තුවකට වරක් අරමුදල වෙත ලැබීම නිසා වර්ෂය තුළ ආයෝජනය සහ වර්ෂය මැද කල්පිරීම නිසා එම පොළී ආදායම් ද ආදායම් ප්‍රකාශය තුලට වර්ෂයේ ආදායම ලෙස ඇතුළත් කිරීමට සිදු වීම.

ලැබිය යුතු ස්ථාවර තැන්පතු ආරම්භක සහ අවසාන ශේෂය හා වර්ෂය තුළ ලද ස්ථාවර තැන්පතු පොළී මුදල් යොදා ගනිමින් පාලන ගිණුමක් පවත්වා ගෙන යාම තුළින් අදායම් ප්‍රකාශනයට වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොළී ආදායම ලබා ගනී.එම නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගනු ලබන වර්ෂයේ අතිරික්තයෙන් එසේ ගණනය කරන ලද වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී ආදායම අඩු කිරීමක් සිදු වන නිසා සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේදී ප්‍රවර්තන වර්ෂයේ සහ පෙර වර්ෂයේ ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ගිණුම් අතර වෙනස ද කාරක ප්‍රාග්ධන අඩු වැඩි වීම් යටතේ දක්වන නිසාත් රු.2,692,742.10ක ස්ථාවර තැන්පතු පොලී ආරම්භක හා අවසාන ශේෂ නැවත වරක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙන් අඩු වීමක් සිදු වේ.එය මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුලනය වීම කෙරෙහි බලපාන බැවින් ඉහත මුදල කාරක ප්‍රාග්ධනයට සිදු කරන ගැලපීමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී අතිරික්තයට එකතු කරන ලදී.

2.(අ).I. ඩෙස්ක්ටොප් පරිගණක මිලදී ගැනීමේදී ආයතන 11 ක් සඳහා මිල කැඳවුම් ලිපි යොමු කරන ලද අතර ආයතන 04 කින් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි.එම මිල ගණන් අතරින් අවම මිල ඉදිරිපත් කර තිබුණේ Lankan an Global Merchant Solution ආයතනයයි. ඒ එක් පරිගණකයක් රු.124,500.00 ලෙසයි. තවද අනෙකුත් සියලු ආයතන ඉදිරිපත් කල මිල ගණන් හා සසඳන විට මෙම ආයතනයේ මිල ගණන් වල රු.35,000.00 පමණ වෙනසක් තිබූ නිස

වාසනා අරමුදලේ ප්‍රසම්පාදන කමිටුව සහ සාමාන්‍යාධිකාරීතුමාගේ වාචික උපදෙස් පරිදි තාක්ෂණ කමිටුව ඉදිරියේ දී විෂය භාර නිලධාරියා විසින් එම ආයතනයට දුරකථන ඇමතුමක් ලබා දී තාක්ෂණික පිරිවිතර පිළිබඳ වැඩිදුර විස්තර විමසන ලදී. එවිට එම ආයතනය මඟින් ප්‍රකාශ කර සිටියේ එම ලියවිලි සැකසූ නිලධාරියා විසින් පිරිවිතර සියල්ල සපයන බවට ලකුණු කර එවා තිබුණත් මිල ගණන් සකසන විට Microsoft Office Package (Lifetime) යන මෘදුකාංගයට අදාළ මිල ගණන් එකතු කර නොතිබූ බවයි.එම ආයතනය විසින් තාක්ෂණ කමිටුව රැස් වූ දිනයේදීම Microsoft Office Package (Lifetime) මෘදුකාංගයට අදාළ මිල ගණන් ෆැක්ස් පණිවිඩයක් හරහා යොමු කරන ලද අතර එයද ගොනු ගත කර ඇත.මෙම හේතුව නිසා උක්ත ආයතනය ප්‍රතික්ෂේප විය.

ii. කෙටි ආහාර නිෂ්පාදනය හා LED බලබ් නිෂ්පාදනයට අදාලව මිල ගණන් කැඳවීමේදී අදාළ උපකරණ කට්ටලයම සපයනු ලබන ආයතන Yellow page, Rainbow pages තුළ තිබූ හෙයින් ලියාපදිංචි කර තිබූ ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ්‍ය (විවිධ) නීතිගත සංස්ථාවේ සහා වෙනත් ආයතන වලින් මිල ගණන් කැඳවන ලදී.බිම්මල් වගාව සඳහා පාඨමාලාව සිදු කිරීමේදී සියලු උපකරණ කට්ටලයම (සීලර් යන්ත්‍රය, ඉටිකොල 1Kg, තරාදිය 5Kg,වෝටර් කෑන් 7l,ස්ප්‍රේ කෑන් 1) ,ලබා ගත හැකි ආයතන Yellow page, Rainbow pages තුළ නොතිබූ හෙයින් ලියාපදිංචි කර තිබූ ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ්‍ය (විවිධ) නීතිගත සංස්ථාවෙන් පමණක් මිල ගණන් කැඳවන ලදී.

ජංගම සේවයට අදාළ සියලු මුද්‍රණ කටයුතු එකම ආයතනයකින් සිදු කර ගැනීම සුදුසු බව ජංගම සේවයට අදාළ මූලික රැස්වීමකදී අමාත්‍යාංශ ලේකම්තුමා විසින් ප්‍රකාශ කරන ලදී.ඒ අනුව මුද්‍රණ කටයුතු සඳහා අමාත්‍යාංශය විසින් රේන්බෝ පිටු වල සඳහන් ආයතන මඟින් මිල ගණන් කැඳවීම් සිදු කර තිබූ බැවින් ශ්‍රම වාසනා අරමුදල විසින් එම ආයතන මඟින් අත්පත්‍රිකා, පෝස්ටර්, බැනර්, මුද්‍රණයටද මිල ගණන් කැඳවන ලදී.

ආ. හිටපු අමාත්‍යාංශ ලේකම් මේ වන විට විශ්‍රාම ගොස් ඇති අතර මේ වන විට ඔහුගෙන් මුදල් ආපසු අය කිරීම සාධාරණ නොවන බව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් තීරණය කරන ලදී. එසේ වුවද 2020 ජනවාරි මස සිට සභාපති සඳහා වන පැමිණීමේ දීමනාව ලබා නොගන්නා බැවින් 2020 ජනවාරි මස සිට මෙම දීමනාව ගෙවනු නොලැබේ.

2.1. අ,ආ. 2018/2019 වර්ෂ වලදී ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගැනීමට නොහැකි වූ වැඩසටහන් පිළිබඳ විටින් විට කිහිපවරක් අයදුම්පත් නොලැබීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරන ලදී.ඒ අනුව අවශ්‍ය කටයුතු සිදු කිරීමට කමිටුවක් පත් කර එහි වාර්තාව මේ වන විට ලේකම් තුමා වෙත යවා ඇති අතර ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කිරීමට බලාපොරොත්තු වේ.

ඩී.එම්.එස්.අබයගුණවර්ධන,
සභාපති,
ශ්‍රම වාසනා අරමුදල.

ඇමුණුම -01

ශ්‍රම වාසනා අරමුදල 2019 වසර තුල සිදුකරනු ලැබූ වැඩසටහන් පෙළගැස්ම.

1. **දැනුවත් කිරීමේ වැඩසටහන්.**

- 2019-01-17 හවුපෙ වත්ත තේ කර්මාන්තශාලාව, සහ නීලගම වත්ත තේ කර්මාන්තශාලාව
- 2019-01-25 විෂන්කෝ පුද්ගලික සමාගම හා ලියෝච් ලංකා පුද්ගලික සමාගම
- 2019-01-28 29දෙදින ගල්ඔය ප්ලාන්ටේෂන්, හිඟුරාන, අම්පාර දයා ඇපරල් එක්ස්පෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්,නාමල්ඔය මහවැලි අධිකාරිය, රඹකැන්ඔය කලාප කාර්යාලය, මහඔය.බින්තැන්නපත්තුව විවිධ සේවා සමුපාකාර සමිතිය, මහඔය.
- 2019-01- 29 එමරල්ඩ් (පුද්.) සමාගම කොට්ටාව සහ ඔරේන්ජ් (පුද්.) සමාගම
- 2019-01-31 දින D.S.I. සමාගම නාවින්න සහ Ceylon Biscuit Ltd කොට්ටාව.
- 2019-02-14 වන දින Samson's & Sons (pvt) ltd - ගාල්ල හා Amari Hotel
- අධි අන්තරාදායි පීඩන යන්ත්‍ර පරීක්ෂා කිරීම පිළිබඳ සහතික ලත් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන 2019-02- කම්කරු දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරය.
- 2019-02-21වීරා ෆැෂන්,හා සිලෝන් නැෂනල් ඉන්ඩස්ට්‍රීස් රන්දෙනිගල.
- 2019-02-26 Raja Fishing Goods, Omanthai Red Max,Vavuniya
- 2019-02-28 හා 2019-03-01 Texwin Cloth (Pvt) Ltd, Lankapura Apparal (Pvt) Ltd, SMK Millin Engineering (pvt) Ltd, Menaka Rice Product (Pvt) Ltd.පොලොන්නරුව.
- 2019-03-29 Sun Ken Constructions,සහ Rainco Apparel මහනුවර හා කඩුගන්නාව.
- 2019-03-29 වන දින Miriswaththa Estate කළුතර
- 2019-04-09 වන දින Spring View තේ කර්මාන්ත ශාලාව - ලෙල්ලුපිටිය.
- 2019-05-23 වන දින Industrial Park-මිරිජ්ජවිල.
- 2019-06-11 වන දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර.
- 2019-08-29 වන දින Hydramani Garment pvt ltd – අගලවත්ත
- 2019-07-09 වන දින දිස්ත්‍රික් කම්කරු කාර්යාලය - කළුතර
- 2019-07-23 වන දින Ambrosia Tea Factory - වැලිමඩ
- 2019-07-24 El-Teb,ගෝනකැලේ තේ කර්මාන්තශාලාව, Shawlands තේ කර්මාන්තශාලා.
- 2019-09-26,27පොල් වගා කිරීමේ මණ්ඩලය වාරියපොළ, අපනයන සැකසුම් සමාගම-ගල්ගමුව, S.L කොකෝ ෆයිබර් ආයතනය - කොබෙයිගනේ - විහව විස්කම් ආයතනය-රත්මල්වැව, සිල්වා ෆර්නිචර්ස් ආයතනය- වාරියපොළ
- 2019-10-07 වන දින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ශ්‍රවණාගාරය - අවිස්සාවේල්
- 2019-09-10 වන දින ලාෆ්ස් (පුද්) සමාගම - කොළඹ 05
- 2019-11-10 වන දින - මන්නාරම
- 2019-12-10 Rowood Lanka Ltd , Jayani Fasion Garments, Dumra Tex කුරුණෑගල.
- 2019-12-10 වන දින කම්කරු දෙපාර්තමේන්තුව - නාරාහේන්පිට
- 2019-12-17 වන දින Samson Rubber Factory (Pvt) Ltd , Finagle Lanka (Pvt) Ltd, Ravi Industrial (Pvt) Ltd - ගම්පහ.
- 2019-12-31 Melwa Rolling (Pvt) Ltd , Tinpak (Pvt) Ltd, Raksha Apperal (Pvt) Ltd - ගම්පහ.
- 2019-12-17 වන දින MAS Kreeda ආයතනය - මහියංගනය.

2. **සවිබල ගැන්වීමේ වැඩසටහන්**

- 2019 පෙබරවාරි මස 07 වන දින කෑගල් ප්‍රාදේශීය රබර් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේදී.
- 2019 පෙබරවාරි මස 11 වන දින මහනුවර වටගොඩ ශ්‍රී ආනන්ද බෝධී විහාරස්ථානයේදී.
- 2019 අප්‍රේල් මස 02 ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - පදවිය
- 2019 මැයි මස 24 වන දින උණවටුන වැටකේ පන් පුහුණු මධ්‍යස්ථානයේදි.
- 2019 මැයි මස 30 කම්කරු කාර්යාලය - යාපනය.
- 2019 මැයි මස 31 වන දින කුරුණෑගල Kandyan Reach හෝටලය

- 2019 ජූලි මස 27 හා 28 මධ්‍ය මහා විද්‍යාලය - වැලිමඩ
- 2019 අගෝස්තු මස 06 වන දින කොස්ලන්ද විහාරස්ථානය
- 2019 සැප්තැම්බර් මස 03 වන දින කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.
- 2019 සැප්තැම්බර් මස 07 වන දින කොස්ලන්ද අරියවංශාරාමය
- 2019 නොවැම්බර් මස 08 වන දින - හැටන්
- 2019 නොවැම්බර් මස 20 හා 21 වන දින මතුගම / සූරියවැව
- 2019 දෙසැම්බර් මස 16 වන දින නගර සභා ශාලාව - ත්‍රිකුණාමලය.

3. වෛද්‍ය කඳවුරු (අක්ෂි වෛද්‍ය සායන)

- 2019 මාර්තු මස 06 වන දින Peenkanda Estate - නිවිතිගල.
- 2019 අප්‍රේල් මස 05 වන දින සීනි කර්මාන්ත ශාලාව - පැල්වත්ත.
- 2019 අප්‍රේල් මස 06 වන දින ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - මොණරාගල.
- 2019 ජුනි මස 18 වන දින Industrial Park මිරිජ්ජවිල.
- 2019 ජූනි මස 29 වන දින Diana කර්මාන්තශාලාව - මාතලේ.
- 2019 ජූලි මස 04 වන දින ප්‍රාදේශිය සභා කාර්යාලය - පස්සර.
- 2019 ජූලි මස 04 වන දිස්ත්‍රික් කම්කරු කාර්යාලය - පොළොන්නරුව
- 2019 ජූලි මස 05 වන දින ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - ලුණුගල.
- 2019 අගෝස්තු මස 07 වන දින මීගහකිවුල විහාරස්ථානය.
- 2019 සැප්තැම්බර් මස 12 වන දින බිබිල මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.
- 2019 සැප්තැම්බර් මස 19 වන දින ආර්ථික මධ්‍යස්ථානය - කැප්පෙටිපොළ හා රත්නෝදාගම ප්‍රජා ශාලාව - උඟව පරණගම.
- 2019 සැප්තැම්බර් මස 23 වන දින නැවුරබ ආයතනය - පානදුර.
- 2019 ජූලි මස 29 වන දින Hydramani ඇඟළුම් කර්මාන්තශාලාව - මූන්දලම හා Bobby ඇඟළුම් කර්මාන්තශාලාව - කල්පිටිය
- 2019 ජූලි මස 18 වන දින නියෝජ්‍ය කම්කරු කොමසාරිස් කාර්යාලය -යාපනය/ මන්නාරම.
- 2019 ඔක්තෝබර් මස 17 වන දින BOI කලාපය කටුනායක.

4. පාසල් උපකරණ බෙදා දීමේ වැඩසටහන්.

- පාසල් උපකරණ බෙදා දීමේ වැඩසටහන 2019-11- 26 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර
- 2019-11-28,29 රාජපුරගොඩ විද්‍යාලය හා ලුණුගම්වෙහෙර විද්‍යාලය - හම්බන්තොට
- 2019 -12-05 වන දින මොරකැව මහ විද්‍යාලය - හොරොව්පතාන.
- 2019-12- 05 වන දින වරකාපොල පුස්තකාල ශ්‍රවණාගාරය - කෑගල්ල.
- 2019-12-13 වන දින කලාප අධ්‍යාපන කාර්යාලය, පස්සර
- 2019-12-14 වන දින ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, වලස්මුල්ල.



ශ්‍රම වාසනා අරමුදල,අංක 97,ජාවත්ත පාර,කොළඹ 05.
දු.අ 011 2 588 936
ෆැක්ස් 011 2 588 937

சிரம வாசனா நிதியம், இல.97, ஜாவத்தை வீதி, கொழும்பு-05.

தொலைபேசி இல. : 011 2588936

தொலைநகல் இல. : 0112588937

Shrama Vasana Fund, No. 97, Jawatta Road, Colombo 05.
Tele. No. 011 2 588 936
Fax No. 011 2 588 937